# ගොවි ජනතා

## සංවත්සර කලාපය 2025

ISBN 1391-0418




කෘෂිකර්ම අමාත්‍යාංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

# ගොවි ජනතා

## සංවත්සර කලාපය 2025

ප්‍රධාන සංස්කාරක
මහාචාර්ය ඒ.එල්. සන්දිකා

උප ප්‍රධාන සංස්කාරක
ආචාර්ය එන්.පී.ජී. සමන්ත

සංස්කාරක මණ්ඩලය
අනුපා දිසානායක
තුෂාරා ධර්මවර්ධන

අධීක්ෂණය
එස්.ඒ.සී.යූ. සේනානායක

සංස්කාරක
ඩී.එම්. අසංකා ඉන්දීවරී දිසානායක

පිටු සැකසුම හා නිර්මාණය
ඒ.පී. උදේනි කරුණාරත්න

තොරතුරු හා සන්නිවේදන අංශය
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

දුරකතන 0112696981, 0112698540-41
දිගුව 304
ෆැක්ස් 0112691360, 0112692423

## පෙළගැස්ම

53 වැනි සංවත්සරයට ප්‍රවේශයක් 01

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයේ දී සමාජ - ආර්ථික පර්යේෂණයන් හි වැදගත්කම 02

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සංස්ථාපිත කරමින් ගරු කොබ්බෑකඩුව මහතා කළ දේශනය 07

කෘෂිකර්මාන්තයෙන් කෘෂි ව්‍යවසායකත්වයට 10

තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් සඳහා සමාජ විද්‍යා පර්යේෂණයන්ගේ වැදගත්කම 14

පශු සම්පත් අංශයේ සංවර්ධනය සඳහා ගොවිජන ක්ෂේත්‍රයට අදාළව සිදුකළ සමාජ පර්යේෂණයන් හි දායකත්වය 17

මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීම තුළින් ග්‍රාමීය ප්‍රජාවගේ ජීවිත පොහොසත් සහ ලස්සන කරමු 22

ගොවි කාන්තාව සවිබල ගැන් වූ කෘෂි ව්‍යවසායිකාවක් දක්වා දියුණු කිරීමට අදාළව සිදු කළ සමාජ - ආර්ථික පර්යේෂණ වල දායකත්වය 26

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ තොරුතුරු හා සන්නිවේදනය 32

# 53 වැනි සංවත්සරයට ප්‍රවේශයක් .........

සමාජ පද්ධති සහ ජනගහනය විශ්ලේෂණය කිරීම මෙන් ම "ඇඩම් ස්මිත්" විද්වතා සඳහන් කරන ආකාරයට ධනයේ ස්වභාවය හා හේතූන් විමර්ශනය කිරීමට හැකි පර්යේෂණ ප්‍රජාවකගෙන් සුසැදි ආයතනයක් සේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය හැඳින්විය හැකි ය. මෙම ආයතනය 2025 වසරේ පෙබරවාරි 21 වැනි දිනට වසර 53ක කාලයක් සමාජ - ආර්ථික පර්යේෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමී ආයතනයක් සේ කටයුතු කරමින් නව දැනුම ජනනය කොට බෙදාහරිමින් සිදු කරන ලද කාර්යභාරය සැබැවින් ම ඇගයීමට ලක්විය යුතු ය.

සමස්ත සේවා නියුක්තියෙන් 25% පමණ කෘෂිකර්මාන්තයේ නියැළෙන ශ්‍රී ලංකාව වැනි රටක සංවර්ධනය සඳහා සමාජ-ආර්ථික පර්යේෂණ සුවිශේෂී දායකත්වයක් සපයයි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කළ යුතු අතර, කිසියම් රටක වෙසෙන ජනතාවගේ දරිද්‍රතාවය, එම රටේ ජනතාවගේ ජන ජීවිතය හා සමාජ සංවර්ධනයට අහිතකර ලෙස බලපෑ හැකි බැවින්, සමාජයක් ලෙස ඉදිරියට යාමට නම් පර්යේෂණ ඉතාමත් සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන බව මතකයේ රඳවා ගැනීම මහත් සේ වැදගත් වෙයි.

අනෙක් අතට, රටක සංවර්ධනයට මූලිකවන තවත් වැදගත් කාරණයක් වන්නේ එකී රටේ පුරවැසියන්ගේ අධ්‍යාපන මට්ටමයි. එබැවින්, අධ්‍යාපනයට අවශ්‍ය අවස්ථා උදාකරදීම තුළින් ද දරිද්‍රතාවය අඩුකර ගැනීමේ හැකියාව ලැබෙයි.

තව ද, සමාජ - ආර්ථික පර්යේෂණ ඔස්සේ ජනනය වන නව දැනුම ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ තීරණ ගැනීමට භාවිතා කිරීමෙන් රටක් ලෙස ඉදිරි ගමනක් සහතික කළ හැකි ය. බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවලට මෙම කරුණ මඟ හැරී ගොස් ඇති බවක් දැකිය හැකි ය.

කෙසේ වෙතත්, වත්මන් ලෝක ප්‍රවණතා දෙස විමර්ශනාක්ෂිය යොමු කිරීමේ දී ගෝලීකරණය යන්න බැහැර කළ නො හැකි ය. මෙමඟින් ද සමාජ - ආර්ථික, ව්‍යුහයට සිදුකරන බලපෑම අධ්‍යයනය කිරීමට සමාජ - ආර්ථික පර්යේෂණ උපයෝගී කර ගැනීමට සිදු වේ.

එපමණක් ද නොවේ. රටක පවතින සමාජ - ආර්ථික ව්‍යුහය තුළ ආර්ථික හා වෙළෙඳපොළ යන්නට සුවිශේෂී වැදගත්කමක් හිමි වේ. එබැවින්, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය දශක ගණනාවක සිට මිල, පාරිභෝගික හැසිරීම යනාදිය අධ්‍යයනය කරයි. මිල දී ගැනීමේ තීරණ පාරිභෝජන රටා මෙන් ම භාණ්ඩ පිළිබඳ දැනුම යන කරුණු ද රාජ්‍ය තීන්දු තීරණ ගැනීමේ දී භාවිතයට ගනු ලබයි. එබැවින්, සමාජ - ආර්ථික පර්යේෂණ ක්ෂේත්‍රයේ මෙම ආයතනය, අද්විතීය ස්ථානයක් හිමි වී තිබේ. මෙය වඩාත් පැහැදිලි වන අවස්ථාවක් ලෙස මෙම ආයතනය සිදු කරන රාජ්‍ය ප්‍රතිපත්ති ඇගයීමේ පර්යේෂණ කාර්යය දැක්විය හැකි ය.

මෙහි දී සඳහන් කළ යුතු වැදගත් කරුණක් ලෙස කල්පනාකාරී ව සැලසුම්කිරීම සහ වෙහෙස මහන්සි වී වැඩ කිරීම තුළින්, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සුවිශේෂී ස්ථානයක පවතින බව ය. පර්යේෂණ සිදුකිරීම සංකීර්ණ දැවැන්ත මෙන් ම අභියෝගාත්මක ක්‍රියාවලියකි. එසේ වුව ද, එය රටක ප්‍රගමනයට මෙන් ම දැනුමේ දියුණුවට ද ඉවහල් වේ. ජනනය වන නව දැනුම බෙදා හැරීමේ ප්‍රමුඛතම කාර්ය ඉටුකිරීමේ මාවතට අවතීරණ වෙමින් පවතින ආයතනය නව තාක්ෂණය, නව දැනුම හා තාරුණ්‍යය යන සියල්ල භාවිතයට ගනිමින් ස්වකීය කාර්ය ඉටු කරමින් සිටියි.

මෙවන් ප්‍රවේශයක් ඔස්සේ 53 වැනි සංවත්සරය සමරණ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට නායකත්වය සැපයීමට ලැබීම පිළිබඳව මා තුළ නිහතමානී සතුටක් පවතින බව සටහන් කළ යුතු ය. තව ද, පුනරුදය කරා රට ගමන් කරන අවස්ථාවේ දී සමාජ - ආර්ථික පර්යේෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමී ආයතනයක සිට ඊට දායකත්වය සපයන්නට ලැබීම සැබැවින් ම භාග්‍යයකි.




**මහාචාර්ය ඒ.එල්. සන්දික**

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**



# ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයේ දී සමාජ - ආර්ථික පර්යේෂණයන් හි වැදගත්කම

පර්යේෂණයක් යනු විද්‍යාත්මක ගවේශණයකි. එවැනි ගවේෂණ දෙයාකාරයකට සිදු වේ. නව නිෂ්පාදන සහ නව න්‍යායන් සොයා ගැනීම සඳහා සිදු කරනු ලබන ගවේෂණ ඉන් එක් ආකාරයකි. එවැනි, ගවේෂණ මූලික පර්යේෂණ (Basic Research) ලෙස නිර්වචනය කරයි. මෙම සමීක්ෂණ මඟින් ලබා ගන්නා නව නිර්මාණ සහ නව න්‍යායන් ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටළු පිළිබඳ සොයා බලා ඒවාට විසඳුම් ඉදිරිපත් කිරීම දෙවන ආකාරයේ ගවේෂණ ලෙස හැඳින් වේ. එම ගවේෂණ සමාජ ආර්ථික පර්යේෂණ (Socio-economic research) ලෙස හඳුන්වනු ලැබේ. මූලික පර්යේෂණ මඟින් සොයා ගනු ලබන නව නිෂ්පාදන සහ නව න්‍යායන් සාර්ථක ව ක්‍රියාත්මක කිරීමට නම් ඒවා ක්‍රියාත්මක කිරීමේ දී මතුවන සමාජ හා ආර්ථික ගැටළු පිළිබඳ සොයා බැලීම අතිශයෙන් ම වැදගත් වේ. මෙම වැදගත්කම මනාව අවබෝධකරගත් දිවංගත කෘෂිකර්ම අමාත්‍ය හෙක්ටර් කොබ්බෑකඩුව මහතා 1972 වර්ෂයේ දී ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ මූල්‍ය සහ තාක්ෂණ ආධාර ඇතිව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය (ARTI) පිහිටුවන ලදී. එතුමා කරන ලද සේවයට ගරු කිරීමක් වශයෙන් පසු කාලයේ දී මෙම ආයතනය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (HARTI) ලෙසට නම් කරන ලදී. මෙම ආයතනය විවෘත කරන අවස්ථාවේ දී හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා විසින් පවත්වන ලද කථාවේ දී සමාජ, ආර්ථික ප්‍රශ්න පිළිබඳ පර්යේෂණ කිරීමේ වැදගත්කම විස්තර කර තිබේ. එහි කොටසක් පහත දැක් වේ.

"කෘෂිකාර්මික අංශයෙහි සුලු ගොවීන්ගේ සංවර්ධනයට බාධක වශයෙන් ඇත්තේ ශිල්පීය කරුණු වලට වඩා ආයතනික හා ව්‍යුහය සම්බන්ධ කරුණු ලෙස පිළිගෙන ඇත."

ආයතනය පිහිටුවීමේ දී පාර්ලිමේන්තුව විසින් සම්මත 1972 අංක 05 දරන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත ට අනුව සමාජ - ආර්ථික පර්යේෂණ ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා දක්වා ඇත.

1. කෘෂිකාර්මික සංවර්ධනය ට බලපාන ආයතන පිළිබඳ පර්යේෂණ
2. කෘෂිකාර්මික අරමුණු සඳහා යොදාගනු ලබන ඉඩම් ආර්ථිකව ඵලදායී ලෙස භාවිතා කිරීම පිළිබඳ පර්යේෂණ
3. කෘෂිකාර්මික සහ ග්‍රාමීය සංවර්ධනයට සම්බන්ධ සමාජ - ආර්ථික පර්යේෂණ

ඉහත අංශ (3) කෘෂිකාර්මික සංවර්ධනයට දක්වන දායකත්වය වෙන් වෙන් වශයෙන් පහත විග්‍රහ කෙරේ.

කෘෂිකාර්මික සංවර්ධනයට බලපාන ආයතන පිළිබඳ පර්යේෂණවල දී ප්‍රධාන පරමාර්ථය වන්නේ මෙම ආයතන පිහිටුවීමේ දී අපේක්ෂිත අරමුණු කොතරම් දුරට ඉටු වී තිබේ ද? අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට නො හැකි වී ඇත්නම් ඊට බලපා ඇති හේතු සාධක මොනවා ද සහ එකී හේතු පාදක මඟහරවා ගැනීමට ගත හැකි පිළියම් මොනවා ද යන්න පෙන්වාදීමයි. එමෙන් ම, ආයතනයෙ හි කාර්යභාරය, වෙනස් වන ආර්ථික හා සමාජ පසුබිම අනුව වෙනස් විය යුතු ද යන්න සොයා බැලීම ද ආයතන පිළිබඳ පර්යේෂණ මඟින් සිදුකරනු ලැබේ. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා පිහිටුවා ඇති ආයතනයන් හි ප්‍රධාන කාර්යභාරය වන්නේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අවශ්‍ය සේවාවන් සැපයීම යි. උදාහරණයක් ලෙස ව්‍යාප්ති සේවය දැක්විය හැකි ය. එමඟින් බලාපොරොත්තු වන්නේ තාක්ෂණික දැනුම ගොවිජනතාව වෙත ලබා දී උපරිම ඵලදායීත්වයක් ලබාදීමට ක්‍රියා කිරීමයි. එම සේවාව අපේක්ෂිත අන්දමට සිදුවනවා ද යන්න සොයා බැලීම ආයතනික පර්යේෂණ ගණයට ඇතුළත් වේ. සහතික මිල යටතේ ගොවීන්ගේ වී මිල දී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය පිහිටුවන ලදී. වගාවේ දී සිදුවන අවදානම අවම කිරීම සඳහා කෘෂි රක්ෂණ මණ්ඩලය පිහිටුවන ලදී. මේ ආකාරයට ගොවීන්ට අවශ්‍ය සේවාවන් හා පහසුකම් ලබාදීම සඳහා මහ ආණ්ඩුව සහ පළාත් සභා යටතේ ආයතන රාශියක් පිහිටුවා ඇත. මෙම ආයතනවල කාර්යභාරය පිළිබඳ පර්යේෂණ සිදුකිරීම ඉතා වැදගත් බව නූතන කළමනාකරණයේ පියා ලෙස හඳුවනු ලබන පීටර් ඩ්‍රකර් (Peter Dracker) මනාව පැහැදිලි කර ඇත. ඔහු විසින් ප්‍රධාන ප්‍රශ්න පහක් යටතේ ආයතනික පර්යේෂණ සිදුකළ යුතු බව අවධාරණය කර ඇත.

1. ආයතනය පිහිටුවා ඇත්තේ කවර අරමුණු සඳහා ද?
2. ආයතනය පිහිටුවා ඇත්තේ කවුරුන් සඳහා ද?
3. එම සේවාලාභීන් ආයතනයේ කාර්යයන් අගය කරනු ලබන්නේ කෙසේ ද?
4. දැනට ආයතනය කරනු ලබන්නේ කවර කාර්යයන් ද?
5. අනාගතයේ ආයතනය කළ යුත්තේ කවර කාර්යයන් ද?

ඉහත කාරණා ඔස්සේ මෙරට කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අවශ්‍ය උපකාරක සේවා සැපයීමට පිහිටුවා ඇති ආයතනයවල කාර්යසාධනය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම ඉතාමත් වැදගත් ය. මේ ක්ෂේත්‍රය තුළ අදාළ පර්යේෂණ ප්‍රමාණවත් සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව තුළ සිදු වී නොමැත. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයට ආයතනික සහාය ප්‍රමාණවත් නොවන බවට චෝදනා පවතී. මෙම නිසා ශ්‍රී ලංකාවට විවෘත ආර්ථිකයේ ප්‍රතිලාභ අපේක්ෂිත අන්දමට ඉටු කර ගැනීමට නොහැකි වී ඇත.

දෙවන පර්යේෂණ ක්ෂේත්‍රය වන්නේ කෘෂිකාර්මික ඉඩම් භාවිතය පිළිබඳ ව ගවේෂණය කිරීමයි. ඉඩම් යනු රටකට සීමිත සම්පතකි. එබැවින්, ඒවා ආර්ථික වශයෙන් කළමනාකරණය කිරීම වැදගත් ය. එනම්, ඉඩම්වලින් උපරිම ඵලදාව ලබාගත යුතු ය. ශ්‍රී ලංකාවේ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් මිලියන 6.5ක් වන අතර ඉන් කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් මිලියන 2ක් පමණ වේ. එකී බිම් ප්‍රමාණයෙන් 35% පමණ භාවිතා කරන්නේ වී වගාව සඳහා ය. එබැවින්, වී වගාවේ ඉඩම් භාවිතයේ කාර්යක්ෂමතාව පිළිබඳ පර්යේෂණ පැවැත්වීම වැදගත්වේ. වී වගාවට යොදන කුඹුරු ඉඩම්වල ආර්ථික වටිනාකම ඉඩම් හෙක්ටයාර් එකකට ලැබෙන වී ප්‍රමාණය අනුව තීරණය කළ හැකි ය. එම ප්‍රමාණය හෙක්ටරයාර් එකකට මෙට්‍රික් ටොන් 4.5 නැතිනම් කිලෝග්‍රෑම් 4500 ලෙස ගණනය කර ඇත. එකී ප්‍රමාණය හෙක්ටයාර් එකකට මෙට්‍රික් ටොන් 8ක් දක්වා වැඩිකළ හැකි බව පර්යේෂණ මඟින් සොයාගෙන තිබේ. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" නමැති ප්‍රතිපත්ති ප්‍රකාශනයේ හෙක්ටයාර් එකකට ලැබෙන වී අස්වැන්න මෙට්‍රික් ටොන් 6 දක්වා වැඩිකිරීමට යෝජනා කර ඇත. දැනට පවතින තාක්ෂණය අනුව මෙම ඵලදායීතා මට්ටම් කරා ළඟාවිය හැකි අතර ඊට ප්‍රධාන බාධාව සමාජ ආර්ථික සාධක වේ. උදාහරණයක් ලෙස බීජ, තෙල්, පොහොර කලට වේලාවට ලබා ගැනීමේ අපහසුතාව, මුදල් නොමැතිකම විය හැකි ය. එසේ නැතිනම් යොදන ප්‍රමාණය සහ යොදන කාලය පිළිබඳ දැනුවත්භාවයක් නැතිවීම විය හැකි ය. එසේ නැතිනම් ශ්‍රමය හිඟවීම විය හැකි ය. මේ ආදී කරුණු පිළිබඳ ගොවීන් සමඟ සාකච්ඡා කර ගවේෂණය කර විසඳුම් ඉදිරිපත් කිරීම කරනු ලබන්නේ සමාජ - ආර්ථික පර්යේෂණ මඟිනි.

කෘෂිකාර්මික ඉඩම්වල ආර්ථික වටිනාකම පිළිබඳව මුහුණ දෙන අනෙකුත් ප්‍රධාන ගැටළුව නම් වී වගාව ඇතුළු කෘෂිකාර්මික බෝග වගාවේ දී නිෂ්පාදන



වියදම ඉහළ මට්ටමක පැවතීමයි. මේ නිසා ගැටළු ගණනාවක් මතු වී තිබේ. ආහාර වියදම ඉහළ ගොස් රටේ උද්ධමනය වැඩිවීමට හේතු වේ. ගොවීන් ගේ ආදායම අඩුවීම නිසා ඔවුන්ගේ ජීවන තත්ත්වයට අහිතකර ලෙස බලපානු ඇත. ආනයනික ආහාර භාණ්ඩ සමඟ තරඟකිරීමට නො හැකිවීම නිසා රජයට ඉහළ බදු පැනවීමට සිදු වේ. එය උද්ධමනය වඩාත් තීව්‍ර කරයි. එමෙන් ම, කෘෂි අපනයන විදේශීය වෙළෙඳපොළේ තරඟකිරීමට නො හැකි වී ඇත. බරපතල සමාජ ප්‍රශ්නය නම් තරුණ කණ්ඩායම් ගොවිතැනින් ඈත්වීමයි. මෙම තත්ත්වය මඟහරවාගෙන නිෂ්පාදන වියදම අඩුකිරීමට හේතු විද්‍යාත්මක ව සොයා බලා කරුණු ඉදිරිපත්කිරීම සිදු කරනු ලබන්නේ සමාජ ආර්ථික පර්යේෂණ මඟිනි.


කෘෂිකාර්මික ඉඩම්වල ආර්ථික ඵලදායීතාව වැඩිකිරීමේ එක් ක්‍රියාමාර්ගයක් වන්නේ බෝග තීව්‍රතාව (Cropping Intensity) වැඩි කිරීමයි. වසරක් තුළ භූමියේ වගාකරන බෝග ප්‍රමාණය වැඩි කිරීම මෙමඟින් අදහස් කෙරේ. වගා කරන බෝග ප්‍රමාණය දෙගුණයක් නම් තීව්‍රතාවය 200% වේ. සමහර රටවල කුඹුරුවල බෝග තීව්‍රතාවය 400% වේ. ශ්‍රී ලංකාවේ මෙම ප්‍රතිශතය 150% අඩු ය. මෙම තත්ත්වය සොයා බලා විසඳුම් යෝජනා කිරීම සමාජ ආර්ථික පර්යේෂණ මඟින් සිදු වේ. එවැනි පර්යේෂණ සිදුකර “පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්” ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති ආකාරයට කෘෂිකාර්මික ඉඩම් අක්කරයකින් රුපියල් ලක්ෂ 30ක වාර්ෂික ආදායමක් ලබා ගත හැකි ආකාරය සමාජ ආර්ථික පර්යේෂණ තුළින් පෙන්වා දිය හැකි ය.

සමාජ ආර්ථික පර්යේෂණවල තුන්වන කාණ්ඩය වන්නේ කෘෂිකාර්මික සහ ග්‍රාමීය සංවර්ධනය ට සම්බන්ධ සමාජ ආර්ථික කරුණු පිළිබඳ ගවේෂණය කිරීමයි. මෙයට ඉහත සඳහන් කළ ආකාරයට ආයතනික කරුණු සහ ඉඩම් සම්බන්ධ කරුණු හැරුණු විට අනෙකුත් සමාජ, ආර්ථික ගැටළු අධ්‍යයනය කිරීම මෙම කාණ්ඩයට ඇතුළත් වේ. එනම් කෘෂිකාර්මික යෙදවුම්, අලෙවිකරණය, ග්‍රාමීය දරිද්‍රතාවය ආදායම් විවිධාංගීකරණය කිරීම වැනි ක්ෂේත්‍රයන් මේ තුළ අන්තර්ගත වේ. අලෙවිකරණ පර්යේෂණ සහ ආදායම් විවිධාංගීකරණය කිරීම පිළිබඳ පර්යේෂණ මේ තුළ කාලීන වශයෙන් විශේෂ වැදගත්කමක් ගනී. කෘෂි නිෂ්පාදනය දේශගුණික සාධක මත තීරණය වන නිසා අස්වැන්න නෙළීම එක්තරා කාලයකට සිදු වේ. ඒ තුළ නිෂ්පාදනය, පාරිභෝගික ඉල්ලුමට වඩා ඉහළ ගොස් ඇස්වැන්න නෙළන කාලයේ මිල සීඝ්‍ර ලෙස පහළයාමට ලක්වේ. නිෂ්පාදනය කළමනාකරණය කරන ආකාරය පිළිබඳ ගවේෂණයකර මීට සාර්ථක විසඳුම් ලබාදිය හැකි ය. උදාහරණයක් ලෙස එළවළු වැනි ඉක්මණට නරක්වන බෝග ඉල්ලුමට අනුව වගාව සැලසුම් කළ හැක. වී වැනි කල්තබාගත හැකි බෝග අස්වැන්න නෙලූ විගස අලෙවිකරන්නේ හදිසි මුදල් අවශ්‍යතාවන් පියවා ගැනීමට ය. ඒ සඳහා තමන්ගේ නිෂ්පාදන ගබඩාවක තැන්පත්කර රිසිට් පතක් ලබාගෙන එය බැංකුවට ඇපයක් ලෙස තබා ණය ලබා ගැනීමේ ක්‍රමවේද ලොව බොහෝ රටවල

ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ මෙම ක්‍රමය අසාර්ථක ය. සමාජ, ආර්ථික පර්යේෂණ තුළින් මෙයට බලපෑ හේතු අධ්‍යයනය කළ හැකි ය.

ගොවීන්ගේ ආදායම විවිධාංගීකරණය කිරීම කාලීන අවශ්‍යතාවකි. උදාහරණයක් ලෙස වී සඳහා පවතින සහතික මිල දෙගුණ කළත් ඉන් ලැබෙන ආදායමෙන් ගොවි පවුලක් නඩත්තු කළ නො හැකි ය. වී වගාව යනු පූර්ණ කාලීන රැකියාවක් නොවේ. උදාහරණයක් ලෙස වී අක්කරයක් වගා කිරීමට අවශ්‍ය වන්නේ මිනිස් දින 15කි. ඒ අනුව වී වගා කරන ගොවි මහතෙකුට වෙනත් රැකියා කිරීමට ප්‍රමාණවත් කාලයක් පවතී. උදාහරණයක් ලෙස කිරිගවයින් ඇතිකළ හැකි ය. කිරිගවයින් ඇති කිරීම ජංගම බැංකුවක් (Mobile Bank) ලෙස ලොව ප්‍රසිද්ධ වී තිබේ. දිනපතා ආදායම ලැබීම ඊට හේතුවයි. කිරි ගවයාගේ දිනකට කිරි ලීටර් 5ක් ලබා ගතහොත් දිනක ආදායම රු. 800කි. මෙකී ප්‍රමාණය කිරි ලීටර් 10 දක්වා නවීන පන්නයේ කිරි දෙනුන් ඇති කිරීම තුළින් ලබා ගත හැකි ය. එම කිරි ගවයෙකුගේ දිනකට රු.1600 ආදායමක් ලබා ගත හැකි ය. එමෙන් ම, කෘෂි ගව පාලනය තුළින් මුදාහරින අපද්‍රව්‍ය මඟින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කර වී ඇතුළු වගාවන් ට භාවිතා කළ හැකි ය. එමඟින්, ඵලදාව වැඩිකර ආදායම සරුකර ගත හැකි ය. ඉන්දියාවේ ගොවි මහතෙකු 2019 වර්ෂයේ දී බෝග වගාවෙන් ලැබූ ආදායම 38%කි. සත්ත්ව නිෂ්පාදනයෙන් ලැබූ ආදායම 16% කි.

ඉහත කරුණු අනුව සමාජ - ආර්ථික පර්යේෂණ තුළින් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ වර්ධනයට විශාල පිටුවහලක් ලබාදිය හැකි ය. එමෙන් ම, ඊළඟට මතුවන ගැටළු නම් ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික පර්යේෂණ සිදු නොවන්නේ ද යන්නයි. එය සාධාරණ ප්‍රශ්ණයකි. මන්දයත් කෘෂිකාර්මික සංවර්ධනයට බාධා කරන ප්‍රශ්න එනම් යෙදවුම් හිඟකම, ගුණාත්මය අඩුකම, ඉහළ නිෂ්පාදන පිරිවැය, අඩු ගොවිපළ ආදායම, අලෙවි කිරීමේ ගැටළු ආදී ප්‍රශ්න වසර ගණනාවක් තිස්සේ පවතී. මේ සම්බන්ධයෙන් බලපාන කරුණු 03ක් පවතී. එකක් නම් සමාජ - ආර්ථික පර්යේෂණ වලින් සොයාගනු ලබන නිර්දේශ සලකා බලා ක්‍රියාත්මක කිරීමට ශක්තිමත් ආයතන ව්‍යුහයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය වී නැත. උදාහරණ ලෙස ඉන්දියාවේ සැලසුම් කොමිසමක් (Planning Commission ) පර්යේෂණ යෝජනා සලකා බලා සැලසුම් සකස් කිරීම සඳහා ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පාලක මණ්ඩලයට මේ කාර්ය ඉටු කිරීමේ හැකියාව පවතී. එම පාලක මණ්ඩලය කෘෂිකර්මය සම්බන්ධයෙන් ඉහළ පෙළේ ආයතනවල (උදාහරණයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය) ඉහළ නිලධාරීන්ගෙන් සමන්විත වේ. පහත සඳහන් යොජිත රූපසටහන මඟින් මෙය ක්‍රියාත්මක කළ හැකි ආකාරය විග්‍රහකර ඇත.




සමාජ පර්යේෂණයන් හි සාර්ථකත්වය ට බලපාන දෙවන කාරණය වන්නේ ශක්තිමත් ප්‍රායෝගික ව ක්‍රියාකළ හැකි නිර්දේශ ඉදිරිපත් කිරීමයි. මේ සඳහා ලෝකයේ විශේෂයෙන් කලාපයේ රටවල ක්‍රියාත්මක වන සාර්ථක අත්දැකීම් අධ්‍යයනය කිරීම සහ අදහස් හුවමාරු කර ගැනීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ දැනට පවතින ගැටළු බොහොමයකට සාර්ථක විසඳුම් අසල්වැසි ඉන්දියාව ක්‍රියාත්මක කරයි. එමෙන් ම, කලාපීය අනෙකුත් රටවල් සමඟ එක්ව සමාජ, ආර්ථික පර්යේෂණ පැවැත්වීමේ වැදගත්කම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පිහිටුවීමේ පනත තුළ ද සඳහන් කර ඇත. එමෙන් ම, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ ආසියා - පැසිපික් කලාප මධ්‍යස්ථානය (CIRDAP) ආයතනයේ ශ්‍රී ලංකාවේ නියෝජිත ආයතනය ලෙස හෙක්ටර් කොබ්බෑකඩුව



ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ක්‍රියා කරයි. එම ආයතනයේ එක් අරමුණක් වන්නේ කලාපයේ ග්‍රාමීය සංවර්ධනයට අවශ්‍ය දැනුම හුවමාරු කර ගැනීමයි. දැනට එම ආයතනය ඉන්දියාව, මැලේසියාව, ඇතුලු දකුණු ආසියානු රටවල් 12ක් නියෝජනය කරයි. මෙම රටවල වී මිල තීරණය කරන ආකාරය, ආරක්ෂිත තොග පවත්වාගෙන යන ආකාරය, සහ පාරිභෝගික මිල තීරණය කරන ආකාරය පිළිබඳ අධ්‍යයනය කර සාර්ථක වැඩසටහන් ආරම්භ කර ක්‍රියාත්මක කළ හැකි ය.

සමාජ - ආර්ථික පර්යේෂණයන් හි සාර්ථකත්වයට බලපෑ තුන්වන කාරණය නම් එම පර්යේෂණවලින් ලබා ගන්නා සොයා ගැනීම් මත අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමයි. පර්යේෂණ හා පුහුණු එකිනෙකට සම්බන්ධ නිසා ගොවිකටයුතු පර්ය්ෂණ හා පුහුණු කිරීමේ ආයතනය ලෙස නම් කිරීමට මෙය ද හේතු වී ඇත. ශ්‍රී ලංකා ආර්ථිකය 1977 පසු හඳුන්වා දුන් විවෘත ආර්ථිකය සමඟ ව්‍යුහාත්මක වෙනස්කම් ඇති වූවත් කෘෂිකාර්මික ක්ෂේත්‍ර තුළ ඊට සමගාමී වෙනස්වීම් ප්‍රමාණවත්ව සිදු වී නැත. ඒ සඳහා සමාජ - ආර්ථික පර්යේෂණවල සොයා ගැනීම මත ගොවි ජනතාව දැනුමෙන්, කුසලතාවන්ගෙන් සහ ආකල්ප තුළින් සංවර්ධනය කර කෘෂිව්‍යාපාරික ගොවි පරපුරක් හැකි ඉක්මණින් බිහිකළ යුතු ය. ඒ සඳහා ගොවීන් පුහුණු කිරීම්වල ට අමතරව ව්‍යාප්ති නිලධාරීන් පුහුණු කළ යුතු ය. ශ්‍රී ලංකාවේ ව්‍යාප්ති සේවය නිෂ්පාදනයට නැඹුරු වූවකි. ඒ තුළ පරමාර්ථය වන්නේ වැඩි ඵලදාවක් ලබා ගැනීමට අවශ්‍ය දැනුම කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමයි. විවෘත ආර්ථිකය තුළ ව්‍යාප්ති සේවයෙන් බලාපොරොත්තු වන්නේ වගාකළ යුතු බෝගය වගාකළ යුතු කාලය, විකිණිය යුතු ආකාරය සහ විකිණිය යුතු මිල පිළිබඳ නිවැරදි තීරණ ගැනීමට ගොවි ජනතාව දැනුවත් කිරීම, පුහුණු කිරීම සහ ආකල්ප සංවර්ධනය කිරීමයි. විවෘත ආර්ථිකය තුළ ව්‍යාප්ති සේවයේ අරමුණු වන්නේ ලාභ උපරිම කිරීම සඳහා ගොවීන් පෙළඹවීමයි.

වත්මන් රජයේ ප්‍රධාන තේමාව වන්නේ දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමයි. ඒ තුළ කෘෂිකාර්මික සංවර්ධනය ප්‍රමුඛතාවක් ගනී. කෘෂිකාර්මික සංවර්ධනය තුළින් අනිකුත් හැම අංශයකට ම වඩා දුප්පත්කම අඩුකළ හැකි බව ලෝක බැංකුව ඇතුළු ජාත්‍යන්තර ආයතන විසින් පෙන්වා දී ඇත. කෘෂිකාර්මික සංවර්ධනය තුළින් ආහාර සුරක්ෂිතතාව සහතික කළ හැකි ය. රටේ ජනගහනයෙන් 80%ක් පමණ ග්‍රාමීය වන අතර ඔවුන් සෘජුව හෝ වක්‍රව කෘෂිකර්මාන්තය හා සම්බන්ධ වී සිටියි. ඔවුන්ගේ ආදායම ඉහළයාම තුළින් කාර්මික නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ඉහළ යනු ඇත. එමෙන්ම දේශීය ඉතිරිකිරීම් ඉහළ ගොස් ආයෝජන පහසුකම් වර්ධනය වනු ඇත. මේ කරුණු සියල්ල සලකා බලා කෘෂිකාර්මික සංවර්ධනය රටේ ආර්ථිකයේ "ඉනිමඟ" ලෙස අර්ථ දක්වා ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික ගැටළු අධ්‍යයනය කිරීම සඳහා පිහිටුවා ඇති ප්‍රමුඛතම ආයතනය වන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට විශාල දායකත්වයක් ලබාදිය හැකි බව පෙන්වාදිය හැකි ය.



**ආචාර්ය එල්.පී.රූපසේන**

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

**කෘෂි පද්ධති අධ්‍යයනාංශය**

**කෘෂිකර්ම පීඨය,**

**ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය**

# ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සංස්ථාපිත කරමින් ගරු කොබ්බෑකඩුව මහතා කළ දේශනය



ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සංස්ථාවක් වීමේ උත්සවයට සහභාගීවීමට පුළුවන්වීම ගැන මම සතුටු වෙමි. වාසනාවකට මෙන් ආයතනයේ ප්‍රථම පුහුණුවීමේ පාඨමාලාව ඇරඹීමත් අදට යෙදී ඇත.

මෙබඳු ආයතනයක් පිහුටුවීම ගැන අදහස ඇතිවූයේ වර්ෂ 10කට ප්‍රථම අග්නිදිග ආසියාතික ප්‍රදේශ සඳහා ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයක් පිහිටුවීමට යෝජනාවක් ඉදිරිපත් වූ පසුවය.

මෙවැනි ආයතනයකින් අපේක්ෂා කළ කාර්යයන් මෙසේය.

අ. අසල්වැසි රටවල් සම්බන්ධ කර ගෙන ගොවිජන ව්‍යුහයට අදාළ ප්‍රශ්න පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.

ආ. ගොවිජන ප්‍රතිසංස්කරණ සහ අදාළ විෂයයන් සම්බන්ධයෙන් පුහුණුවීමේ පහසුකම් සැපයීම.

ඇ. ගොවිජන ප්‍රශ්න සහ ඊට සම්බන්ධ විස්තර එක්රැස් කරන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

මෙම යෝජිත ආයතනය තමන්ගේ රටෙහි පිහිටුවන ලෙස රටවල් කිහිපයක් විසින්ම ලෝක ආහාර සංවිධානයට ඉල්ලුම් කර තිබුණි. ලංකාණ්ඩුව මගින් ද එවැනි ඉල්ලීමක් කරන ලදී. ලෝක ආහාර සංවිධානය/ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙල සහ ලංකාණ්ඩුව අතර පැවති සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් 1969 වර්ෂයේ දී මෙම ආයතනය ලංකාවේ පිහිටුවීමට තීරණය විය.

**ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සංස්ථාගත කිරීමේ දී 1972 පෙබරවාරි 21 වන දින ගරු කෘෂිකර්ම හා ඉඩම් ඇමති හෙක්ටර් කොබ්බෑකඩුව මහතා කළ දේශනය**

ලෝක ආහාර සංවිධානය/එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙල සහ ලංකාණ්ඩුව අතර අත්සන් කළ ගිවිසුම අනුව මුල් පස් වර්ෂය තුළ ලෝක ආහාර සංවිධානය/ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙල විසින් ආයතනය පවත්වා ගෙන යාමට ආධාර කරනු ඇත. පස් වර්ෂය අවසානයෙහි මෙය සම්පූර්ණ වගකීමෙන් යුතු ජාතික ආයතනයක් බවට පෙරලෙනු ඇත. විශේෂඥ නිලධාරීන්ගේ වේතන, විදේශීය පුහුණුවීමේ හා උපකරණවල වියදම් සඳහා ලෝක ආහාර සංවිධානය/ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙල විසින් රුපියල් ලක්ෂ පනස් පහක පමණ ආධාර මුදලක් වෙන් කරනු ඇත. ලංකාණ්ඩුව විසින් ආයතනයේ ඉඩම සහ ගොඩනැගිලි ද, දේශීය නිලධාරීන්ගේ සේවාව ද, වෙනත් පහසුකම් ද සපයනු ඇත. මෙම ආයතනය ඉදිරි කාලය තුළ එය පිහිටුවා ඇති රටෙහි පමණක් නොව, මුළු ආසියාතික රටවල අවශ්‍යතාවන් සපුරාලනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සුදුසු ස්ථානයක් නොමැතිවීම, නිලධාරීන්ගේ වෙනස්වීම් ආදී කරුණු කිහිපයක් නිසා ආරම්භක අවදියේ දී ආයතනය ප්‍රමාණවත් වේගයෙන් ගමන් කිරීමට අපොහොසත් විය. එම අපහසුකම් දැන් මහ හැරී තිබේ. වර්ෂ දෙකක "ළදරු විය" ඉක්මවා ඇති ආයතනය, රටෙහි ආර්ථිකයට ඉතා වැදගත් වන කෘෂිකර්ම අංශයට උසස් සේවාවක් ඉටු කිරීමට සූදානමින් සිටී



ලංකාවේ ගොවිජන ව්‍යුහය, වැවිලි අංශය හා ගොවි අංශය වශයෙන් බෙදිය හැකිය. විශාල ඉඩම්, අධික ධන ආයෝජන, කම්කරු සංවිධානය හා වැඩි නිෂ්පාදන වැවිලි අංශයේ කැපී පෙනෙන ලක්ෂණ වෙත්. වෙනත් අංශවල ආයෝජනය සඳහා විදේශීය විනිමය වැඩි කොටසක් ලැබෙන්නේ වැවිලි අංශයෙන්ය. ලෝක වෙළෙඳපොළේ බඩු මිල පහත බැසීම නිසා මෑතක සිට වැවිලි අංශයට ද නව ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වී ඇත. මෑතක දී උද්ගත වූ මෙම තත්ත්වය නිසා නිසරු තේ හා රබර් ඉඩම්වල වෙනත් බෝග වැවීමේ අවශ්‍යතාවය මෙන්ම අඩුවෙන් මුදල් යොදවන සුළු ඉඩම් අංශයේ නිෂ්පාදිතය වැඩි කිරීමේ අවශ්‍යතාවය ද තදින්ම දැනී ඇත.

ආහාර බෝග වැවීමේ නිරතව සිටින සුළු ඉඩම් අංශය කෘෂිකාර්මික ආර්ථිකයේ කේන්ද්‍රස්ථානය ලෙස මට හැඟී යයි. රැකී රක්ෂා පුළුල් ලෙස උත්පාදනය කළ යුත්තේ මෙම අංශය මඟින්ය. වැඩි ආදායම් අපේක්ෂා කරන, වැඩියෙන් රැකී රක්ෂාවලට අවස්ථා සපයන ගොවිතැන් ක්‍රමයක් බිහි කිරීමේ කාර්යභාරය සුළු ඉඩම් අංශය වෙත පැවරේ. මේ ක්‍රමයෙන් ඉදිරි වර්ෂ 5 හෝ 6 තුළ දී ආනයන ද්‍රව්‍ය සැලකිය යුතු අයුරින් කපා හරිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කෘෂිකර්ම අංශයෙහි සුළු ගොවීන්ගේ සංවර්ධනයට බාධක වශයෙන් ඇත්තේ ශිල්පීය කරුණුවලට වඩා ආයතනික හා ව්‍යුහය සම්බන්ධ කරුණු බව පිළිගෙන ඇත. නවීන කර්මාන්ත හා පර්යේෂණවලින් නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේ ශිල්පීය ක්‍රම සොයා ගෙන ඇතත්, ඒවා පුළුල් ලෙස ගොවීන් අතර ව්‍යාප්ත වී නොමැත. එබැවින්, විටින් විට රජය මඟින් ආයතනික ප්‍රතිසංශෝධන ක්‍රියාත්මක කර ඇත. ඉන් සමහරක් සාර්ථක ප්‍රතිඵල ලබා දී ඇත. කෙසේ වෙතත්, ආයතනික ප්‍රතිසංශෝධන ස්ථිර පදනමක් නොමැතිව සීමිත දැනුම මත කරන තාවකාලික පිළියම් විය. මේ නිසා මෙම ආයතනික කරුණු ගැඹුරු ලෙස හැදෑරීමත් සෑම තරාතිරකම අයවළුන් වෙත ඒ සම්බන්ධ පුහුණුවක් ලබාදීමත් අත්‍යවශ්‍යමය.

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට වැදගත් වැඩ කොටසක් ඉටුකිරීමට සිදු වන්නේ මෙතැන්හි දී ය. කෘෂිකර්ම අංශයට සම්බන්ධ වූ අත්‍යවශ්‍ය සමාජීය හා ආයතනික කටයුතු පිළිබඳ විස්තර එක්රැස් කොට ප්‍රතිපත්ති සාධනයට උපකාරි වෙන අයුරින් හා තත්ත්වාකාරයෙන් එම කරුණු ඉදිරිපත් කිරීම ආයතනයට භාර කටයුත්තකි. බෝග වැවීම, සතුන් ඇති කිරීම පිළිබඳ ශිල්පීය ක්‍රමවලට වඩා ඉතා පුළුල් කාර්යයක් ඉටු කිරීමට ආයතනයට පැවරී ඇත. මුළු ගොවි ජීවන ක්‍රමය රඳා පවත්නා වූ ආහාර බෝග, ගව බෝග හා ගොවියා සහ වෙළෙඳපොළත්, සමාජයත් අතර අන්‍යෝන්‍ය සම්බන්ධය ගැඹුරින් වටහා ගැනීම ආයතනයේ අරමුණ වේ.



ගොවිජන අංශයෙහි සංවර්ධන ඇන හිටීමට හේතු වූ ව්‍යුහය සම්බන්ධ වූ මූලික කරුණක් නම් ඉඩම් භුක්ති ක්‍රමයයි. ප්‍රථමයෙන් කුඩා කාණ්ඩවලට බෙදී යන්නා වූ සුළු ඉඩම් පිළිබඳ ප්‍රශ්නය සඳහන් කළ හැක. කැබලිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉඩම් අයිතිය හා අඳ අයිතිය පිළිබඳ තරඟ වැඩිවන අතර එම ඉඩම් වලින් යැපෙන්නා වූ ගොවි ජනයාට ආයෝජන ශක්තිය හීනවීමත් ආදායම් මාර්ග හිඟවීමත්, රක්ෂා විරහිතවීමත් ආදී ප්‍රශ්න කිහිපයකට මුහුණපෑමට සිදු වේ. දෙවනුව කැබලිවලට කැඩුණා වූ කුඩා ඉඩම් නිසා, විශේෂයෙන් පස හා වතු පාලනයට සම්බන්ධ වූ විවිධ ප්‍රශ්න උද්ගත වේ.

1958 වර්ෂයේ කුඹුරු පනතින් අඳ ගොවීන්ට අඳ අයිතිය තහවුරු කොට, ඉඩම් භුක්තිය පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කිරීමට ප්‍රයත්නයක් දරන ලදී. එහෙත් ක්‍රියාත්මක කිරීමේ දී ඉෂ්ඨ ප්‍රතිඵල ලැබුණේ නැත. වර්තමානයේ පවත්නා ඉඩම් අයිතිය මූලික වශයෙන් වෙනස් වීමට ඉඩ තිබේ. මෙහිලා ගොවි කටයුතු පුහුණු කිරීමේ ආයතනයට වැදගත් කාර්යයක් පැවරේ. ඉඩම් නිරවුල් කිරීම, කෘෂිකාර්මික ණය හා අලෙවිය, සහතික මිල සහ පොදු වශයෙන් කෘෂිකර්මයෙහි සමාජ-ආර්ථික රටාව වර්තමාන සංවර්ධන අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රබල වෙනස්වීම්වලට භාජනය විය යුතුයි. මහවැලි සහ උඩවලවේ වැනි යෝජනා ක්‍රමවල ඇති වී ගෙන යන විශාල සංවර්ධන ක්‍රම නිසා මෙම අංශවලට පර්යේෂණ හා පුහුණු කිරීමේ වැඩකටයුතු තවත් වැදගත් වෙයි.

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් පර්යේෂණ කටයුතු මෙහෙයවීමේ දී රටෙහි ප්‍රශ්න තත්ත්වානුකූලව වටහාගෙන, ක්‍රියාත්මක විසඳුම් කෙරෙහි යොමු කෙරෙන කරුණු ඉස්මතු කළ යුතු වෙයි. ආකල්පයෙන් ද, ක්‍රියාවෙන් ද, ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ක්‍රියාශීලී ආයතනයක් වන බව නොඅනුමාය. සංවර්ධන වැඩපිළිවෙලට සම්බන්ධ වූ සෑම කෙනෙක්ම ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රගතිය ගැන විමසිලිමත්ව හා බලාපොරොත්තු සහිතව බලා සිටින බව මට විශ්වාසයි. “මෙම ආයතනයේ කටයුතු සාර්ථක වේවා” යි ප්‍රාර්ථනා කරමි.

***උපුටා ගැනීම - ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය යනුවෙන් නාමගත කිරීම හා ආයතනයේ 23 වන සංවත්සරය වෙනුවෙන් සකසන ලද ග්‍රන්ථයෙනි.***



# කෘෂි කර්මාන්තයෙන් කෘෂි ව්‍යවසායකත්වයට

පසුගිය දශක තුනක පමණ කාලය තුළ කෘෂිකාර්මික වෙළෙඳපොළ සහ ජාත්‍යන්තර වෙළෙඳාම තුළ කෘෂි නිෂ්පාදන අලෙවි ක්ෂේත්‍රයෙහි වේගවත් පරිවර්තනයක් සිදුවිය. ප්‍රාදේශීය සහ ජාතික වෙළෙඳ රටාවන්ගෙන් ඔබ්බට යමින් ගෝලීය වෙළෙඳ රටාවන් වෙත වේගයෙන් අනුගතවීම ගෝලීය ප්‍රවණතා දෙස අවධානයෙන් බැලීමේ දී හඳුනාගත හැකි ය. මෙහි අර්ථය වන්නේ දේශීය වශයෙන් කුඩා බිම් කොටසක වගාවෙහි යෙදෙන කෘෂි නිෂ්පාදකයෙකුට වෙනත් රටක මහා පරිමාණ වාසි ලබන කෘෂි නිෂ්පාදකයෙකු සමඟ එකම වෙළෙඳපොළක් තුළ තරඟකාරීත්වයකට මුහුණ දීමට සිදුවීමයි. මේ අනුව, කෘෂිකර්මාන්තය ගෝලීය ප්‍රවණතා නිසි පරිදි හඳුනාගනිමින් පරිවර්තනයකට ලක් කිරීමේ අවශ්‍යතාවය පවතින අතර විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි රටවල ට එය ඉතා වැදගත් වේ.

සංවර්ධනය වෙමින් පවතින රටවල කෘෂි නිෂ්පාදකයින්ට තම වගා කටයුතු වාණිජකරණයට ලක්කිරීම සඳහා වන පීඩනය හෝ පෙළඹවීම හේතු කිහිපයක බලපෑම මත සිදු වේ. විශේෂයෙන් ම, වගාවට යොදා ගන්නා ඉඩම් ප්‍රමාණය ක්‍රමයෙන් කුඩාවීම සහ එකී හේතුව මත තම පවුලේ අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් භූමියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට සිදු වීම. එනම් පවත්නා සීමිත භූමි සම්පත උපරිම ඵලදායීතාවයෙන් භාවිතා කිරීමේ වගා රටාවන් වෙත ප්‍රවේශ වීමට සිදු වීම. දෙවනු ව නාගරීකරණය සහ ජනගහන සංවර්ධනය පෙන්වා දිය හැකි ය. මෙමඟින් අදහස් වන්නේ ජනගහනය සහ නාගරීකරණය සමඟ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වන ඉල්ලුමේ වෙනස්කම් නැතහොත් පරිවර්තනයන් නිවැරදිව ග්‍රහණය කරගත යුත බවයි. මේ හේතුවෙන් කෘෂිකර්මය වාණිජ මුහුණුවරකින් සිදු කිරීමේ අවශ්‍යතාවය පැනනඟී. එමෙන් ම, සමස්තයක් ලෙස සිදුවන නවීකරණ ක්‍රියාවලියට කෘෂි නිෂ්පාදකයාට නැතහොත් ගොවියාට  මුහුණු දීමට සිදු වේ. එය ඉතා සරල ව විග්‍රහ කළහොත් ගොවියාට තම වගාවෙන් හෝ කෘෂි නිෂ්පාදන ක්‍රියාවලියෙන් උපයා ගන්නා ආදායමෙන් තම පවුලේ අවශ්‍යතා සපුරා ගැනීමට සිදුවෙයි. එනම් නවීකරණය සමඟ මතුවන පවුල් ඒකකයේ වුවමනාවන් ද පරිවර්තනයට ලක් ව තිබේ. විශේෂයෙන්ම අධ්‍යාපන, සෞඛ්‍ය, ප්‍රවාහන සහ සන්නිවේදන ක්ෂේත්‍රයන්හි ඇතිවන නවීකරණය සමඟ ඒ සඳහා වැඩි වියදමක් පවුල් ඒකකයක් ලෙස දැරීමට සිදු වේ. එබැවින්, කෘෂිකාර්මික ක්‍රියාකාරකම් වාණිජ මුහුණුවරකින් ඉලක්කගත ව සිදු කිරීම කෙරෙහි සංවර්ධනය වෙමින් පවතින රටවල විශේෂ අවධානය යොමු විය. කෘෂිකර්මාන්තය වාණිජකරණයට ලක්කිරීමේ දී ව්‍යවසායකත්ව







සංකල්පය ඉතා වැදගත් වේ. සෑම ගොවියෙකුට ම ව්‍යවසායකත්ව දෘෂ්ඨියෙන් තම කටයුතු කෙරෙහි යෙදීමට පෙළඹවීමක් ඇති කිරීම කෘෂිකර්මය වාණිජකරණය දක්වා පෙළඹවීමේ ක්‍රියාවලියේ දී ඉතා වැදගත් වේ.

ඉතා සරල අර්ථයෙන් ව්‍යවසායකත්වය යනු වටිනාකම් නිර්මාණය කිරීම සහ ලාභ උත්පාදනය කිරීම අරමුණු කරගෙන මූල්‍ය සහ උපායමාර්ගික අවදානම ගනිමින් ව්‍යාපාරික අදහසක් හඳුනා ගැනීම, සංවර්ධනය කිරීම සහ එය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියයි. ඒ තුළ නවෝත්පාදනය, ගැටළු විසඳීම සහ වෙළෙඳපොළ අවස්ථා හඳුනා ගැනීමේ හැකියාව අන්තර්ගත වේ. ව්‍යවසායකයින් ලෙස ගත් විට ව්‍යාපාර ආරම්භ කරන සහ ක්‍රියාත්මක කරන පුද්ගලයින් අදහස් වන අතර, බොහෝවිට නව නිෂ්පාදන, සේවා හෝ නව්‍ය ව්‍යාපාර ආකෘති හඳුන්වාදීමක් සිදු වේ.

මේ අනුව, ව්‍යවසායකත්වයෙ හි ප්‍රධාන අංග ලෙස නවෝත්පාදනය නැතහොත් නව අදහස්, අවදානම ගැනීම, අවස්ථා හඳුනා ගැනීම, ව්‍යාපාර කළමනාකරණය සහ ආර්ථික සහ සමාජ ප්‍රතිලාභ උත්පාදනය කිරීම පෙන්වා දිය හැකි ය. නවෝත්පාදනය යන්න තුළ නවතම අදහස් නැතහොත් නව නිෂ්පාදන හෝ ක්‍රියාවලීන් නිර්මාණය කිරීම අදහස් වේ. අවිනිශ්චිතතාවයෙන් යුතු ව කාලය, මුදල් සහ සම්පත් ආයෝජනය කිරීම, අවදානම ගැනීම යන්නෙන් අදහස් වේ. වෙළෙඳපොළ හැඩය සහ



අවශ්‍යතා හඳුනා ගැනීම තම ව්‍යාපාරය නිසි පරිදි ස්ථානගත කිරීමට ඉවහල් වේ.

කෘෂි ව්‍යවසායකත්වය යනු ලාභදායී හා තිරසාර ගොවිතැන් ව්‍යාපාර නිර්මාණය කිරීම සඳහා කෘෂිකාර්මික අංශයට ව්‍යාපාර සහ නවෝත්පාදන මූලධර්ම යෙදීමේ ක්‍රියාවලියයි. වෙළෙඳපොළ අවස්ථා හඳුනාගැනීම, නව තාක්ෂණය අනුගමනය කිරීම සහ කෘෂිකාර්මික ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා අවදානම කාර්යක්ෂමව කළමනාකරණය කිරීම එයට ඇතුළත් වේ.

කෘෂි ව්‍යවසායකත්වයේ ප්‍රධාන අංග ලෙස,

1. ගොවිතැන් නවෝත්පාදනය
2. වෙළෙඳපොළ නැඹුරු ප්‍රවේශය
3. නවීන තාක්ෂණයට අනුගත වීම.
4. අවදානම් කළමනාකරණය
5. අගය එකතු කිරීම
6. තිරසාර භාවිතාවන් සහ
7. කෘෂි ව්‍යාපාර අකෘති පෙන්වා දිය හැකි ය.

ගොවිතැන් නවෝත්පාදනය යටතේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා නිවැරදි වූ ගොවිතැන් ක්‍රම භාවිතය, කාබනික ගොවිතැන සහ කෘෂි සැකසුම වැනි උසස් ශිල්පීය ක්‍රම භාවිතා කිරීම පෙන්වා දිය හැකි ය. කෘෂි ව්‍යවසායකත්ව අංග අතර වෙළෙඳපොළ නැඹුරු ප්‍රවේශය ඉතා සුවිශේෂී තැනක් ගනී. විශේෂයෙන් ම, පාරිභෝගික ඉල්ලුම නිසි පරිදි හඳුනා ගැනීම සහ ඉහළ වටිනාකමක් ඇති බෝග, පශු සම්පත් හෝ කෘෂි පාදක නිෂ්පාදන වෙත යොමු වීම වැදගත් වේ. ඉහත සඳහන් කළ ආකාරයට නාගරීකරණය, ජනගහන වර්ධනය සහ නවීකරණය වූ සමාජ ආර්ථික වටපිටාව නිවැරදිව හඳුනාගෙන කෘෂිකාර්මික කටයුතු ඊට ගැළපෙන පරිදි හැඩගස්වා ගැනීම ඉතා වැදගත් වේ.

නවීන තාක්ෂණයට අනුගතවීම තුළින් පිරිවැය අවම කරගනිමින් උපරිම ලාභ ඉපැයීමේ ක්‍රමවේදයක් වෙත ප්‍රවේශවීමේ හැකියාව පවතී. විශේෂයෙන් ම, යාන්ත්‍රීකරණය, කෘත්‍රිම බුද්ධිය, වාරිමාර්ග පද්ධති සහ සුහුරු කෘෂිකාර්මික විසඳුම් ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ. විවිධාංගීකරණය සහ රක්ෂණය වැනි ක්‍රම භාවිතයෙන් දේශගුණික විපර්යාස, මිල උච්ඡාවචනයන් සහ පළිබෝධ පැතිරීම වැනි අභියෝග ජය ගනිමින් අවදානම කළමනාකරණය කර ගැනීම කෘෂිකර්මය කෘෂි ව්‍යවසාය දක්වා ගමන් ගැනීමේ දී ඉතා වැදගත් අංගයක් ලෙස පෙන්වා දිය හැකි ය.

කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රාථමික මට්ටමෙන් අලෙවි කිරීම වෙනුවට අඩ නිමි හෝ නිමි භාණ්ඩ බවට පත්කිරීම අගය එකතු කිරීම ලෙස ඉතා සරලව හැඳින්විය හැකි ය. මෙහි දී යම් වටිනාකමක් එක්කළ භාණ්ඩ වෙළෙඳපොළට සැපයීම සහ එමඟින් වැඩි වාසි ලබා ගැනීමේ හැකියාව පවතී. ඒ සඳහා වන වෙළෙඳපොළ අවස්ථාවන් නිවැරදිව හඳුනාගත යුතු ය.

තිරසාර භාවිතයන් යන්නෙන් දිගුකාලීන ශක්‍යතාව සඳහා පරිසර හිතකාමී සහ දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම අදහස් වේ. කෘෂි ව්‍යවසායකත්වයට යොමුවීමේ දී ඉදිරි වෙළෙඳ ගිවිසුම්, කොන්ත්‍රාත් ගොවිතැන්, කෘෂි සංචාරක කර්මාන්තය සහ සැපයුම්දාම ඒකාබද්ධ කිරීම වැනි විවිධ කෘෂි ව්‍යාපාර ආකෘති වෙත යොමුවීමේ හැකියාව පවතී.

කෘෂි ව්‍යවසායකයා නිරන්තර තොරතුරු පිපාසයකින් පෙළෙන්නකු විය යුතුය. තම අවස්ථාවන් නිසි පරිදි ග්‍රහණය කර ගැනීම සඳහා නිරන්තර අවධානයෙන් සිටින්නකු විය යුතු ය. තමා අවට ඇති ව්‍යාපාරික පරිසරය පිළිබඳ නිසි අවබෝධයක් ඇත්තකු බවට පත්වීම ද අවශ්‍යය. ඒ

සඳහා විවිධ ආයතන නිකුත් කරන දත්ත සහ තොරතුරු සඳහා ප්‍රවේශවීමේ මාර්ග හඳුනා ගැනීම අවශ්‍ය වේ.

කෘෂි ව්‍යවසායකත්වය ග්‍රාමීය සංවර්ධනය, රැකියා උත්පාදනය සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. එමඟින් ගොවීන්ට සාම්ප්‍රදායික ගොවිතැනෙන් ඔබ්බට ගොස් ව්‍යාපාරවල ට නැඹුරු වී ආර්ථික වර්ධනයට දායකවීමට හැකියාව ලැබේ.

ශ්‍රී ලාංකික කෘෂි ව්‍යවසායකත්වය එහි වර්ධනයට හා ශක්‍යතාවයට බාධාකරන බහුවිධ අභියෝගවල ට මුහුණ දෙයි. මෙම අභියෝග ආර්ථික, තාක්ෂණික, පාරිසරික සහ ප්‍රතිපත්ති සම්බන්ධ සාධක ලෙස පුළුල් ව වර්ගකළ හැකි ය. ආර්ථික අභියෝග ලෙස ඉහළ නිෂ්පාදන පිරිවැය, සීමිත ණය ප්‍රවේශය, වෙළෙඳපොළ අස්ථාවරත්වය, අගය එකතු නො කිරීම යන කරුණු පෙන්වාදිය හැකි ය.

තාක්ෂණික අභියෝග ලෙස නවීන තාක්ෂණික ක්‍රමෝපායන් අඩුවෙන් අනුගමනය කිරීම, විශේෂයෙන් ම, යාන්ත්‍රීකරණය සහ සුහුරු කෘෂිකාර්මික තාක්ෂණය සීමිත ලෙස භාවිතා කිරීම, ප්‍රමාණවත් නොවන පර්යේෂණ සහ සංවර්ධනය සහ උසස් කෘෂිකාර්මික ශිල්ප ක්‍රම පිළිබඳ දැනුම සහ පුහුණුව සඳහා වන සීමිත ප්‍රවේශය පෙන්වා දිය හැකි ය.

පාරිසරික සහ දේශගුණික අභියෝග ලෙස බෝග වගාවන් ට අහිතකර ලෙස බලපාන දේශගුණික විපර්යාස සහ ආන්තික කාලගුණය, පාංශු ඛාදනය සහ ඉඩම් ඛණ්ඩනය, වන විනාශය සහ නිතර නිතර සිදුවන පළිබෝධ උවදුරු පෙන්වා දිය හැකි ය. මෙකී තත්ත්වයන් ගොවිපළ පිරිවැය ඉහළයාම මෙන් ඵලදායීතාවය පහළයාමට ද හේතු වේ.

ප්‍රතිපත්ති සහ ආයතනික අභියෝග ලෙස දිගුකාලීන ව පවතින යම් යම් ප්‍රතිපත්තිවල අනුකූලතාවයක් නො පැවතීම, දුර්වල සැපයුම්දාම සහ යටිතල පහසුකම්, ආනයනික පොහොර සහ කෘෂි රසායනික මත අධික ලෙස රඳා පැවතීම සහ ඉඩම් අයිතිය පිළිබඳ ගැටළු වැනි කරුණු ගොනුකළ හැකි ය. විශේෂයෙන් ම, ගබඩා පහසුකම් සහ ප්‍රවාහන ජාලයන් හි පවත්නා දුර්වලතා හේතුවෙන් පසු අස්වනු හානිය ඉහළ ප්‍රතිශතයක පැවතීම ද ලාංකීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ දැකිය හැකි අභියෝගයකි.

සමාජ සහ සංස්කෘතික අභියෝග කෙරෙහි ද මෙහි දී අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. නවීන ගොවිතැන් ක්‍රම කෙරෙහි දිරිගැන්වීම අඩු මට්ටමක පැවතීම මත තරුණ කොටස් කෘෂිකර්මාන්තයෙන් ඈත්වීම ද සැළකිල්ලට ගතයුතු කරුණකි. කාන්තාවන් කෘෂිකර්මාන්තයේ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන නමුත් බොහෝවිට ඉඩම්, ණය සහ තාක්ෂණය සඳහා සීමිත ප්‍රවේශයක් පවතී. සාම්ප්‍රදායික මානසිකත්වය සහ නවීන කෘෂිකාර්මික ව්‍යාපාර ආකෘති වෙත ප්‍රවේශවීමට දක්වන මැලිකම ද කෘෂිකර්මාන්තය කෘෂි ව්‍යවසායකත්වයක් දක්වා පරිවර්තනය කිරීමේ දී පැන නඟින අභියෝග අතර වේ.

මෙකී අභියෝග ජය ගැනීම සඳහා දිගුකාලීන ඉලක්කගත මැදිහත්වීමක් අවශ්‍ය වේ. කෘෂි තාක්ෂණික සහ ඩිජිටල් ආර්ථික ප්‍රවේශයක් සඳහා ආයෝජන දිරිගැන්වීම, ගොවි සමුපකාර සහ ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සහ මූල්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම, පර්යේෂණ සහ ව්‍යාප්ති සේවා පුළුල් කිරීම, ග්‍රාමීය යටිතලපහසුකම් හා වෙළෙඳපොළ සම්බන්ධතා වැඩි දියුණු කිරීම, නිවැරදි දත්ත වෙත ප්‍රවේශවීමේ හැකියාවන් වර්ධනය කිරීම සහ තිරසාර ගොවිතැන් ක්‍රම සහ දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය වෙත දිරිගැන්වීම මඟින් ඉහත දැක් වූ අභියෝග යම් පමණකට ජයගැනීමේ හැකියාව පවතී.

අභියෝග මධ්‍යයේ වුව ද, නිසි ප්‍රතිපත්ති, තාක්ෂණය සහ වෙළෙඳපොළ පදනම් කරගත් නවෝත්පාදනය මඟින් සහය වෙමින් ශ්‍රී ලාංකීය කෘෂිකර්මාන්තය, කෘෂි ව්‍යවසායකත්වය දක්වා පරිවර්තනය කිරීමේ විභවතාවයක් පවතී. විශේෂයෙන් ම, ව්‍යවසායකත්ව මානසිකත්වය ගොවි සමාජය තුළ වර්ධනය කිරීම සහ ව්‍යවසායකත්ව දෘෂ්ටියෙන් තම කෘෂිකර්මික කටයුතු දෙස බැලීමට ගොවි සමාජය පෙළ ගැස්වීම කෘෂිකර්මික පුනරුදයක් අපේක්ෂා කරන වර්තමානය ට ඉතා වැදගත් වේ.




**ආචාර්ය එන්.පී.ජී. සමන්ත**

**අතිරේක අධ්‍යක්ෂ**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

# තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් සඳහා සමාජ විද්‍යා පර්යේෂණයන්ගේ වැදගත්කම



ශ්‍රී ලංකාව ඉතා ඈත අතීතයේ සිට ම කෘෂිකර්මාන්තය මත පදනම් වූ දේශයකි. වර්තමානයේ දී ශ්‍රී ලාංකික ශ්‍රම බලකායෙන් 26%ක් පමණ සෘජු ව හෝ වක්‍ර ව කෘෂිකර්මාන්තය මත යැපෙන බව 2022 මහ බැංකු වාර්තා පෙන්වා දී තිබේ. තව ද, ග්‍රාමීය ජනගහනයෙන් 1/3ක් පමණ සිය ජීවනෝපාය ලෙස කෘෂිකර්මාන්තය භාවිතා කරයි. එම නිසා ම, කෘෂිකර්මාන්තය, ශ්‍රී ලංකාවේ ජාතික දළ දේශීය නිෂ්පාදනය, ජාතික ආහාර සුරක්ෂිතතාවය සහ තිරසාර ආර්ථික සංවර්ධනය සඳහා සෘජු බලපෑමක් ඇති කිරීමට සමත් වන්නා වූ ක්ෂේත්‍රයක් ලෙස හඳුනා ගත හැකි ය. එසේ වුව ද, වර්තමානයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය විවිධ වූ සමාජ - ආර්ථික හා පාරිසරික වශයෙන් ඇති වන්නා වූ ගැටලු හා බාධක රැසකට මුහුණ දෙමින් පවතී.

මෑත කාලීන ව භූමිය ඉතා සීඝ්‍ර ව විඛණ්ඩනය වීම, වගා කළ හැකි භූමි ප්‍රමාණය අඩුවීම, භූමියේ හා කෘෂි නිෂ්පාදනයන් හි ඵලදායීතාවය අඩුවීම, තරුණ ප්‍රජාව කාර්මික හා සේවා ක්ෂේත්‍ර කරා ඇදී යාම, දේශගුණික වෙනස්කම් ආශ්‍රිත බලපෑම, අවිනිශ්චිතතාවය හා අවදානම ඉහළ යෑම, වෙළෙඳපොළ නියාමනය නිසි පරිදි සිදු නොවීම ආදී අභියෝග රාශියකට මුහුණ දීමට කෘෂිකර්මාන්තයෙහි නියැළෙන්නන් හට සිදු වී තිබේ.

මෙවන් පසුබිමක හඳුනාගත් ගැටලු හා අභියෝගයන් දුරලීම සඳහා නොයෙකුත් ක්‍රමවේදයන්, නව්‍යකරණයන් , ඩිජිටල්කරණයන්, තොරතුරු හා තාක්ෂණික ප්‍රවේශයන් මෙන් ම නොයෙකුත් පර්යේෂණ ව්‍යාපාතීන් ඉතා වැදගත් වේ. මේවා තුළින් පවතින ගැටලුවල ට විසඳුම් සෙවීම, ඵලදායීතාවය ඉහළ නැංවීම හා අනාගතයට නව්‍යකරණය වීම වැනි සුභවාදී ක්‍රියාමාර්ග කරා අවතීර්ණ විය හැකි ය. එබැවින්, ලෝකයක, දේශයක, කුසගිනි නිවීම සඳහා අවශ්‍ය කෘෂිකාර්මික අභිවෘද්ධිය වෙනුවෙන් පර්යේෂණ ව්‍යාපෘති ඉතා වැදගත් වේ. එසේ වුව ද, මෙම කිනම් මට්ටමක හෝ පර්යේෂණ ක්‍රියාත්මක විය යුත්තේ බිම් මට්ටමේ ගොවි ජනතාව තුළිනි. ඒ සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නියැළෙන ගොවි මහත්ම මහත්මීන්ගේ හා ඔවුන්ගේ කුටුම්භයන් තුළ වූ ආකල්ප, හැකියාව, උනන්දුව හා ශක්‍යතාවය පිළිබඳ දැනුවත් වීම නැතහොත් අවබෝධයක් පැවතීම අත්‍යවශ්‍ය වේ. එබැවින්, ගැටලු හඳුනා ගැනීම, විසඳුම් සෙවීම හා









නව්‍යතාවයන් එළි දැක්වීම මේ කුමන අවස්ථාවේ දී හෝ අදාළ පාර්ශ්වයන්ගේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳ පෙර හා පසු විපරමක් අගනේ ය.

සමාජ - ආර්ථික පර්යේෂණය යනු සමාජ හා ආර්ථික පද්ධති තුළ ඇති සංකීර්ණ අන්තර් ක්‍රියාවක් අවබෝධ කරගැනීමට උපකාරී වන්නා වූ වැදගත් මෙවලමකි. මෙම අන්තර් විෂය පද්ධතිය තුළින් සමාජ ව්‍යුහ, සංස්කෘතික විශ්වාස, පුද්ගල හැසිරීම්, ආකල්ප සහ ආර්ථික පද්ධති අතර ඇති සම්බන්ධතාවය පිරික්සා බලනු ලබයි. එතුළින් සමාජ සංවර්ධනය සඳහා බලපාන්නා වූ මූලික සාධක තේරුම් ගැනීමට හැකියාවක් ලැබේ. තව ද, සමාජ ආර්ථික පර්යේෂණ තුළින් සමාජ විචල්‍යතා, ප්‍රවණතා සහ හේතු ප්‍රථිඵල සම්බන්ධතා අනාවරණය කරමින් සමාජ හා ආර්ථික සාධක අතර ඇති අන්තර් ක්‍රියාවන් විමසා බලයි. මෙය සාම්ප්‍රදායික ආර්ථික විශ්ලේෂණයට පමණක් සීමා වනවා ට වඩා පුළුල් මානයක් ගන්නා අතර එහි දී, ආර්ථික ක්‍රියාවලි තුළ පවතින සමාජයීය පරිසරය ද සළකා බලනු ලබයි.

ඉහත කරුණු සළකා බලන විට, ශ්‍රී ලාංකික කෘෂිකාර්මික ක්ෂේත්‍රය ද ආර්ථිකමය හා සමාජීය කරුණු තුළ ඉතා තදින් බැඳී පවත්නා වූත් එම සාධක තුළින් සංකීර්ණ වූත් පද්ධතියක් ලෙස හඳුනා ගත හැකි ය. එනම්, ශ්‍රී ලංකාව තුළ විහිදී ඇත්තේ විවිධාංගීකරණය වූ කෘෂිකාර්මික පද්ධතියකි. මෙම කෘෂි පද්ධතිය විවිධ වූ සමාජ තලයන් හි සිටින්නා වූ ක්‍රියාකාරිකයින්ගෙන් සමන්විත වන අතර එයට ම අනන්‍ය වූ ආර්ථිකදාමයන් පවත්නා ක්ෂේත්‍රයකි. ඔවුන් විවිධ ආගම්වලට මෙන් ම විවිධ ජාතීන්වලට අයත් වේ. තව ද, ශ්‍රී ලංකාව තුළ ඇති එකිනෙකට වෙනස් වූ භූගෝලීය හා දේශගුණික සාධක මත විශ්ලේෂණය වූ බෝග වගා රටාවක් ඉතා පැහැදිලි ව දැක ගත හැකි ය. උදාහරණයක් ලෙස පුත්තලම, කුරුණෑගල, ගම්පහ දිස්ත්‍රික්ක ආශ්‍රිත පොල් ත්‍රිකෝණය, වියළි කලාපය තුළ ඇති වී, බඩඉරිඟු වැනි බෝග වගාව සහ උඩරට -තෙත් කලාප තුළ විහි දී ඇති තේ වගාවන් ගත හැකි ය. මෙම සියලුම වගාවන් නැවතත් අපනයන බෝග, යැපුම් බෝග හා ක්ෂේත්‍ර බෝග ලෙස වර්ග කළ හැකි ය. පශු සම්පත් සත්ත්ව, ධීවර හා මත්ස්‍ය ක්ෂේත්‍ර ද කෘෂිකර්මාන්තය තුළ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරනු ලබයි. මෙම විස්තෘත කෘෂිකර්මාන්තය තුළ කාන්තාවන්ගේ ද දායකත්වය ඉතා ඉහළ මට්ටමක පවතී. එපමණක් නොව, කෘෂිකර්මාන්තය තුළින් ගොඩනැඟුණු සමාජීය වශයෙන් බැඳුණු විවිධ සමාජ ජාලයන් හඳුනා ගත හැකි ය. මෙසේ එකිනෙකට

වෙනස් වූ වපසරින්වලින් සමන්විත කෘෂි ක්ෂේත්‍රය සඳහා කෝකටත් තෛලය වැනි විසඳුම් යොදාගත නො හැකි ය. එමෙන් ම, මේවායේ ගැටලු හා අභියෝග ද එකිනෙකට වෙනස් වේ. එබැවින් මෙම සියලුම සමාජීය ආර්ථික රටා අධ්‍යයනය කිරීම සඳහා සමාජ ආර්ථික පර්යේෂණයන් යොදා ගැනීම අත්‍යවශ්‍ය වේ. එහි දී ප්‍රධාන විචල්‍ය ලෙස ජනගහන විශේෂාංග (Socio Demographic Factors) (වයස, ස්ත්‍රී පුරුෂ බව, අධ්‍යාපන මට්ටම, ආදායම් වියදම් විෂමතා) මෙන්ම ගොවිපළ ආදායම, බිම් අයිතිය හා දුරස්ථභාවය ආදී වූ කරුණු ද සළකා බලනු ලබයි. අවශ්‍ය විචල්‍ය සඳහා වූ දත්ත වගුගත කිරීමෙන් අනතුරුව දත්ත විශ්ලේෂණය කිරීම සිදු කෙරේ. මෙම විශ්ලේෂිත තොරුතුරු මත පදනම් ව ඉතා නිරවද්‍ය වූත්, විනිවිද වූත්, තීරණ හා තීන්දු ගත හැකි ය. එමගින්, කෘෂිකර්මාන්තය තුළ දැනට පවත්නා ප්‍රතිපත්ති, ව්‍යාපෘති, උපදේශන සේවා, සහය සේවා සහ අනෙකුත් වැඩසටහන් තුළ පවතින ඵලදායීතාවය පිරික්සීම සිදුකළ හැකි ය. තවදුරටත් ඒ ආශ්‍රිත වූ ගැටලු හා බාධක හඳුනා ගනිමින් නව ප්‍රතිපත්ති සහ ප්‍රසම්පාදන නියමිත කාලවල දී නියමිත පුද්ගලයන් සඳහා ලබාදීම සිදු කළ හැකි වේ. එමගින් සම්පත් නිසි ලෙස බෙදී යෑම තුළින් සමානාත්මතාව හා කාර්යක්ෂමතාව නිසි පරිදි ළඟා කර ගැනීමේ හැකියාව ලැබේ.

තව ද, කම්කරු වෙළෙඳපොළ හා රැකියා අවස්ථාවන් සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට මෙම අධ්‍යයනයන් තුළින් හැකි වේ. එමගින් කෘෂිකර්මාන්තය ආශ්‍රිත නව රැකියා අවස්ථා හඳුනාගනිමින් වැටුප් විෂමතා සහ රැකියා සුරක්ෂිතභාවය මැනවින් සාක්ෂාත් කර ගත හැකි ය. මෙමගින් ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය දියුණු කළ හැකිය. තරුණ ප්‍රජාව කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ තවදුරටත් රඳවා ගැනීමේ ක්‍රමෝපායයන් සහ විභවතාවන් මනාව වටහා ගැනීමට හැකි වේ. රට තුළ පවතින්නා වූ දරිද්‍රතාවය, දිළිඳුකම හා ආහාර අනාරක්ෂිතභාවය සඳහා විසඳුම් නිතැතින්ම ලැබේ.

මෙම මූලික ප්‍රතිලාභයන්ට අමතර ව, නව වෙළෙඳපොළ ක්‍රමවේදයන් හඳුනාගැනීම තුළින් නව වෙළෙඳපොළ අවස්ථා (ජාතික මෙන් ම ජාත්‍යන්තර) සඳහා අවකාශය විවර වේ. එමගින් අතරමැදියන් නිසා ඇති වන්නා වූ වෙළෙඳපොළ ගැටලු සඳහා සාර්ථක විසඳුම් ලැබෙනු නො අනුමාන ය. තව ද, දැනට පවත්නා වූ කෘෂි වෙළෙඳපොළ පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා ද සමාජ -ආර්ථික අධ්‍යයනයන් යොදාගත හැකි වේ.

මෙලෙස, නව අධ්‍යයනයන් තුළින් නිර්ණායක ගොඩනගමින්, නිගමනයන් ට එළැඹෙමින් සහ විශ්ලේෂණාත්මක තොරතුරු යොදා ගනිමින් නව ප්‍රතිපත්ති සැලසුම්කරණය වඩාත් විශ්වාසදායක ව හා ප්‍රයෝජනවත් ලෙස ක්‍රියාත්මක කිරීමට ආර්ථික හා සාමාජීය පර්යේෂණයන් උපකාරී වේ. අවසාන වශයෙන් මෙම සමාජ - ආර්ථික අධ්‍යයනයන් සමාජ ප්‍රගතිය සහ මානව සුබසාධනය සඳහා ඉතා වැදගත් දායකත්වයක් සපයනු ලබයි.




**ආචාර්ය ඩී.එන්. කෝරළගම**

**YPARD ශ්‍රී ලංකා (අනුශාසක)**

කෘෂි ආර්ථික විද්‍යා හා ව්‍යාපාර අධ්‍යයනාංශය

කෘෂිකර්ම පීඨය

රුහුණු විශ්වවිද්‍යාලය





**එම්.ඩබ්.කේ.කේ. දිල්රුක්ෂි**

**තාවකාලික සහකාර කථිකාචාර්ය**

කෘෂි ආර්ථික විද්‍යා හා ව්‍යාපාර අධ්‍යනාංශය

කෘෂිකර්ම පීඨය

රුහුණු විශ්ව විද්‍යාලය









# පශු සම්පත් අංශයේ සංවර්ධනය සඳහා ගොවිජන ක්ෂේත්‍රයට අදාළව සිදුකළ සමාජ ආර්ථික පර්යේෂණයන් හි දායකත්වය

**ගො**විජන සංවර්ධනය සඳහා සමාජ - ආර්ථික පර්යේෂණ මඟින් ඉහළ දායකත්වයක් සපයනු ලබයි. ගොවිජන ක්ෂේත්‍රයේ ගැටළුවල ට අදාළ ව සමාජ - ආර්ථික පර්යේෂණ සිදු කිරීම, විවේචනාත්මක විශ්ලේෂණය සිදු කිරීම හා නිසි අවබෝධයක් ලබාදීම මඟින් ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ සංවර්ධන වෘත්තිකයන්ට අදාළ ප්‍රතිපත්තිමය තීරණ නිසියාකාරව ක්‍රියාත්මක කළ හැකි ය. එමෙන් ම, ගොවිජන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය මඟින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් හා ග්‍රාමීය දරිද්‍රතාවය අවම කිරීමේ ක්‍රියාමාර්ග සඳහා ඵලදායී මැදිහත්වීමක් සිදු කළ හැකි ය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ට අවුරුදු 53ක් සපිරෙන මේ මොහොතේ රටේ ගොවිජන ක්ෂේත්‍රයේ සංවර්ධනය ට ආයතනයේ දායකත්වය ඉමහත් ය. මෙම ආයතනනය 1972 අංක 5 දරණ පාර්ලිමේන්තු පනත ට අනුව රටේ ගොවි ජනතාවගේ සමාජ - ආර්ථික ගැටළු පිළිබඳ පර්යේෂණ පැවැත්වීමේ මූලික අරමුණ සහිත ව ස්ථාපිත කරන ලදී. එම කටයුත්ත බලාපොරොත්තු වූ අයුරින් ම සිදු කරමින් මේ වනවිට පර්යේෂණ වාර්තා 600කට අධික ප්‍රමාණයකට දායකවීම ආයතනය ලැබූ භාග්‍යයකි. එමෙන් ම, මෙම කාලය පුරා ම කාලෝචිත සහ ඉතා වැදගත් සමාජ, ආර්ථික ගැටළු පිළිබඳ සම්මන්ත්‍රණ, අවශ්‍ය දැනුම ගොවි ජනතාවට ලබාදීමට පුහුණු වැඩසටහන් ද ආයතනය මඟින් ප්‍රමුඛතාවය සලකා ක්‍රියාත්මක කරයි.

**සමාජ ආර්ථික පර්යේෂණ**

සමාජ ආර්ථික පර්යේෂණ යනු සමාජ සාධක සහ ආර්ථික ක්‍රියාකාරකම් අතර අන්තර් සම්බන්ධිත සම්බන්ධය පරීක්ෂා කරන අධ්‍යාපන ක්ෂේත්‍රයකි. ආර්ථික වෙනස්කම් සමාජ ජීවිතයට බලපාන ආකාරය සහ විවිධ ගොවිජන ගැටළුවල සමාජ - ආර්ථික පැතිකඩ විද්‍යාත්මක ව විශ්ලේෂණය කර ගැටළු සහ විසඳුම් හඳුනාගෙන විද්‍යාත්මකව ගැටළු විසඳීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට අවශ්‍ය තොරතුරු සහ දත්ත සැපයීමයි.

සමාජ - ආර්ථික පර්යේෂණවල දී සංකීර්ණ සමාජ සහ ආර්ථික අන්තර් ක්‍රියා විවිධ පැතිකඩයන් ඔස්සේ නිරීක්ෂණය කර අදාළ දත්ත හා තොරතුරු විවිධ පාර්ශ්වකරුවන්ගෙන් සමීක්ෂණ, සම්මුඛ සාකච්ඡා හා නාභිගත කණ්ඩායම්, නිරීක්ෂණ චාරිකා ආදි විවිධ පර්යේෂණ ක්‍රම මඟින් රැස්කර විශ්ලේෂණ කිරීම සිදු කරයි. එසේම සපයාගත් තොරතුරු

විද්‍යාත්මකව ප්‍රකාශනයට පත් කිරීම මගින් තීරණ ගන්නා විවිධ කණ්ඩායම්වල ට එම තොරතුරු බෙදා හැරීම සිදු වේ. තව ද, විෂය ක්ෂේත්‍රය මගින් සමාජ වශයෙන් සංස්කෘතික සම්මන්ත්‍රණ, පුද්ගල චාර්යාවන්, ආර්ථික පද්ධති සහ වෙළෙඳපොළ හැසිරීම, නිෂ්පාදන ව්‍යුහයන් ආදිය සාකච්ජා කරේ. එමෙන්ම ආර්ථිකයේ විවිධ පැතිකඩවල දත්ත සහ තොරතුරු මත පදනම් ව සංඛ්‍යාන ක්‍රමවේද යොදා ගනිමින් විශ්ලේෂණය කිරීම මගින් ලබාදෙන තොරතුරුවල නිරවද්‍යතාවය ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනයට මං පෙත් විවර කරයි.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය පුරා වසර 53 තිස්සේ ගොවිජන ක්ෂේත්‍රයට අදාළ ව සමාජ - ආර්ථික පර්යේෂණ සිදු කළේ ප්‍රධාන වශයෙන් පර්යේෂණ අංශ 05ක් යටතේය. එනම් ග්‍රාමීය සංවර්ධන අංශය, පාරිසරික අංශය, ආහාර පද්ධති අංශය, අධ්‍යාපනික හා පුහුණු අංශය, දත්ත කළමණාකරන අංශය වශයෙනි. තොරතුරු සහ සන්නිවේද අංශය මඟින් මෙසේ සිදුකරන පර්යේෂණ ග්‍රන්ථ, ඒවාට අදාළ පර්යේෂණ පත්‍රිකා සහ අනෙකුත් ප්‍රකාශන ප්‍රකාශනයට පත් කරයි.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ගොවි ජනතාවගේ සමාජ - ආර්ථික ගැටළු සඳහා විශේෂ අවධානය යොමු කිරීමේ දී පශු සම්පත් අංශය ගැන ද විශේෂ අවධානයක් පසුගිය වසර 20 ඇතුළත යොමු කරන ලදී. මෙහි දී, විශේෂයෙන් ම, කිරි නිෂ්පාදනයට හා අනෙකුත් සත්ත්ව නිෂ්පාදකයන් ට අදාළව ඉතා වැදගත් පර්යේෂණ ගණනාවක් පැවැත්වීමේ හැකියාව ලැබුණි. කිරි නිෂ්පාදනය ට බලපාන සාධක සහ කිරි නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ අධ්‍යයනය 2005 වර්ෂයේ සිදු කළ අතර ඒ මඟින් කිරි නිෂ්පාදනය ට ඉතා වැදගත් වන සාධක මොනවාද යන්න හඳුනා ගන්නා ලදී. එහි දී, කිරි ගවයින් සඳහා ලබාදෙන ආහාර වර්ග, ආහාර ප්‍රමාණයන්, තෘණ හා සාන්ද්‍ර ආහාර ලබාදිය යුතු ආකාරය පිළිබඳව අවධානය යොමු කරන ලදී. එසේ ම, නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම මඟින් කිරි මිල තීරණය කිරිමට අවශ්‍ය දත්ත ප්‍රතිපත්ති සම්පාදකයින්ට සපයා දෙන ලදී.

මෙයට අමතර ව 2009 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද කිරි ගම්මාන ව්‍යාපෘතියට අදාළ ව මධ්‍ය කාලීන ඇගයීම දිස්ත්‍රික්ක 10ක් පදනම් කරගෙන තොරතුරු රැස් කරන ලදී. මෙම කිරි ගම්මාන වැඩි දියුණු කිරීමේ වැඩසටහනේ ප්‍රධාන අරමුණ වුයේ ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය සහ කිරි පාරිභෝජනය ඉහළ නැංවීම, කිරි කර්මාන්තය තුළ ආදායම් උත්පාදන සහ ස්වයංරැකියා අවස්ථා වැඩි දියුණු කිරීම, ගව පාලනය තුළ සමෝධාන කෘෂිකර්මාන්තය සඳහා ගොවීන් යොමු කිරීම හා ගොවීන් අතර කණ්ඩායම් හැඟීම් ඇති කරවා කිරි ගව පාලනය සමුහයක් ලෙස එක්ව ඉදිරියට ගෙන යෑමයි. ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එම ව්‍යාපෘතිය මඟින් උපාය මාර්ග 18ක් සහ ක්‍රියාකාරකම් 05ක් හඳුනා ගෙන පැවති අතර එක් කිරි ගම්මානයකින් ගොවීන් 20ක් තෝරාගෙන ගම්මානයේ කිරි කර්මාන්තය දියුණු කිරීම සඳහා දළ වශයෙන් රු.ලක්ෂ 05ක මුදලක් වෙන් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ මධ්‍ය කාලීන ඇගයීම මඟින් පෙන්වා දී ඇත්තේ කිරි ගම්මාන ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලැබූ ගොවීන්ගෙන් 96%ක්ම ගව ගාල් සංවර්ධනය සඳහා ආධාර ලබාගෙන ඇති බවයි. ඊට අමතර ව, ප්‍රධාන වශයෙන් ම එම ව්‍යාපෘතිය මඟින් අදාළ ප්‍රදේශවල සමස්ත කිරි නිෂ්පාදනය හා සාමාන්‍ය කිරි නිෂ්පාදනය ඉහළ ගොස් තිබුණි. පර්යේෂණයේ ප්‍රතිඵලවලට අනුව පැහැදිලි වුයේ එක් සතෙකුගේ කිරි නිෂ්පාදනය දිනකට ලීටර් 4.28 සිට ලීටර් 6.44 දක්වා වැඩි වී ඇති බවයි. එසේ ම, මෙම ගොවීන්ගේ ගව පට්ටියක් තුළ සිටින සතුන් සමුහය තුළ කිරි ලබාදෙන සතුන් ප්‍රමාණය (Milking Animal) වැඩිකොට ගෙන ඇත. කෙසේ වෙතත්, මෙම අධ්‍යයනයට අනුව හෙළි වුයේ මෙම ව්‍යාපෘතිය සඳහා ගොවීන් තෝරා ගැනීමේ දී සමහර ප්‍රදේශවල නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොමැති බවයි. එසේ ම, සමහර ගොවීන් ව්‍යාජ දත්ත දක්වමින් ආධාර පමණක් ලබාගෙන ඇත. ඊට අමතර ව, සමහර ගොවීන් එනම් 5%ක් පමණ ගව ගාල් වෙනත් කටයුතු සඳහා යොදා ගෙන තිබුණි. එසේ ම, කිරි ගම්මාන ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ ආකාරයට ගොවීන් සාමුහික ව තීරණ ගැනීම, කිරි ගම්මාන මට්ටමින් ප්‍රාදේශීය පුහුණු කිරීමේ මධ්‍යස්ථාන සහ කිරි ගවපාලනය පිළිබඳ ආකෘති (dairy farm models ) හඳුන්වාදීම, පොදු තෘණ භුමි ඉදි කිරීම සහ ඒවා පවත්වාගෙන යෑම, කණ්ඩායම් ගත ව ගවරෝග නිවාරණය සඳහා පියවර ගැනීම ගොවීන්ට හා කිරි ගවයින්ට රක්ෂණ ක්‍රම හඳුන්වා දීම වැනි උපාය මාර්ග ගණනාවක් මෙම ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කර නොමැත.

මෙම මධ්‍යකාලීන කිරි ගම්මාන ඇගයීමේ අධ්‍යයනය මඟින් විවිධ නිගමන හා නිර්දේශ පශු සම්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. එහි



දී, කිරි නිෂ්පාදන ඉහළ නැංවීම පිණිස සුළු පරිමාණ කිරි ගොවීන්ගේ ගව පට්ටිය (herd) තුළ කිරි ගවයන් කිහිපදෙනෙකු අඛණ්ඩ ව පවත්වාගෙන යාම ඉතා වැදගත් ය. ඊට අමතර ව, ඉහළ ගුණාත්මයෙන් යුතු (high yielding animals) සතුන් ලබාගැනීමේ පහසුකම් රජය මඟින් ලබාදිය යුතු ය. එසේ නොමැති නම් පෞද්ගලික අභිජනන මධ්‍යස්ථාන ඇති කොට නවක කිරි ගොවීන්ට විශ්වාසදායී ලෙස කිරි ගවයන් මිල දී ගැනීමට අවස්ථාව සලසා දිය යුතු ය. එමෙන් ම, ගොවීන්ට නවීන තාක්ෂණය පිළිබඳව අවශ්‍ය පුහුණු වීම ලබාදීම, සත්ත්ව ආහාර පහසු මිලට ලබාගැනීමේ අවස්ථා සැලසීම හා සත්ත්ව පාලනය සඳහා අවශ්‍ය ණය පහසුකම් ලබාදීම වැනි සොයා ගැනීම් 2009 වර්ෂයේ ඉදිරිපත් කළ ද, 2025 වන විටත් මෙම ගැටළු එලෙසම පවතී. එබැවින්, මෙම ගැටළු විසඳීමට ප්‍රතිපත්ති සම්පාදකයින් දිරි ගැන්විය යුතුය. එසේ ම, දියර කිරි පරිභෝජනය සඳහා ශ්‍රී ලාංකික පරිභෝගිකයන් වැඩි නැඹුරුවක් දක්වා නොමැති බැවින් දියර කිරි බෙදා හැරීමේ ක්‍රමවේදයක් හා ඒ සඳහා උචිත වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට රජය මඟින් පාරිභෝගිකයන් දැනුවත් කළ යුතු වේ. එහි දී දියර කිරි පරිභෝජනයේ වැදගත්කම රටපුරා දිපව්‍යාප්ත ව ඉහළ නැංවිය යුතු අතර දියර කිරි පරිභෝජනය ඉහළ නැංවීම පිණිස දියර කිරි මිල ජනතාවට දැරිය හැකි පරිදි සංශෝධනය කළ යුතු ය.

එමෙන් ම, 2015 වර්ෂයේ ප්‍රකාශනයට පත් කරන ලද "වියළි කලාපයේ කිරි ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වය" යන මාතෘකාව යටතේ සිදු කරන ලද අධ්‍යයනයේ දි වියළි කලාපයේ ගොවීන් හට මුහුණදීමට සිදුවන කිරි නිෂ්පාදනයේ අභියෝග සාකච්ඡා කරන ලදී. එහි දී, වියළි කාලවල දී නියමිත ප්‍රමිතියට සත්ත්ව ආහාර ලබාදීම, පැය 24 පුරා ජලය සැපයීම, වියළි කාලගුණික තත්ත්වවල ට ගැලපෙන සතුන් ලබාගැනීම, සතුන්ගේ නිෂ්පාදනයට අදාළ ව ජාන වැඩි දියුණු කිරීමට සම්බන්ධ කෘත්‍රිම සිංචනය (Artificial insemination) ආදි ක්ෂේත්‍රවල ඇති ගැටළු, ඒවාට අදාළ යෝජනා සහ ගත හැකි ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳ විස්තරාත්මක ව විශ්ලේෂණය කොට ඉදිරිපත් කර ඇත. එහි දී, විශේෂයෙන් ම, වියළි කාලවල දී තත්ත්වයෙන් උසස් ආහාර සැපයීමේ අසීරුතාවයක් නිසා සයිලේජ් (silage ) වැනි ආහාර නිපදවීමට ගොවීන් දිරි ගැන්විය යුතු ය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මඟින් රටේ විවිධ සංවර්ධන අවස්ථාවල ට අදාළව තීන්දු තීරණ ගැනීමට පර්යේෂණ හා තොරතුරු ඉදිරිපත් කරයි. මේ යටතේ දී "සීතාවක අභිමන්" නැමැති සීතාවක ප්‍රදේශයේ සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අදාළ ව අර්ධ නාගරික කලාපයේ කිරි ගොවිතැන පිළිබඳව විශ්ලේෂණය සිදු කරන ලදී. මෙහි දී, කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල, හෝමාගම හා පාදුක්ක යන ප්‍රදේශ ආශ්‍රිත ව අර්ධ නාගරික කලාපයේ කිරි නිෂ්පාදනය පිළිබඳව ඇඟයීමක් සිදු කරන ලදී. එම ප්‍රදේශ ආශ්‍රිතව ඉතාමත් තිරසාර ලෙස මී ගවයින් පාලනය සිදු කරන බවත්, එම සතුන්ට අවශ්‍ය ආහාර

හා තෘණභූමි ලබාදීමේ ගැටළු ඇති බවත් අනාවරණය විය. එමෙන් ම, සතුන් සම්පතක් ලෙස එම ගොවීන්ගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමට බෙහෙවින් උපකාරි වී ඇති බව අනාවරණය විය. මෙම පර්යේෂණවලින් සොයා ගත දෑ ප්‍රදේශීය ව කිරි ගොවීන්ගේ ආර්ථික මට්ටම දියුණු කිරිම සඳහා අදාළ ගොවීන් දැනුවත් කරමින් මෙම ආයතනයේ දැනුම ඔවුන්ට පුහුණු වැඩසටහන් මඟින් ලබා දෙන ලදී.



එසේ ම, 2017 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද කුඩා පරිමාණයේ කුකුළු ගොවිපළවල ඇඟයීමේ අධ්‍යයනය සිදු කරන ලදී. මෙම අධ්‍යයනයට පාදක වුයේ රජය මඟින් ග්‍රාමීය ජනතාවගේ ප්‍රෝටීන අවශ්‍යතාවය ඉහළ නැංවීම සඳහා අඩු ආදායම්ලාභී පවුල් තෝරාගෙන විශේෂයෙන් ම කාන්තාවන් මූලික කරගෙන නිදැලි ක්‍රමයට කුකුළු පාලනය සඳහා එක් දිනක් වසසැති පැටවුන් 10 බැඟින් ලබාදෙන ලදි. මෙම ව්‍යාපෘතිය මුළු රට පුරා ක්‍රියාත්මක විය. මෙම අධ්‍යයනය මඟින් අනාවරණය වුයේ ව්‍යාපෘතිය මඟින් බලාපොරොත්තු වූ පරිදි බොහෝ ගොවි පවුල් පෝෂණීය අවශ්‍යතා සඳහා බිත්තර පරිභෝජනය කරන බවත්, එම ප්‍රමාණය වාර්ෂික ඒක පුද්ගල පරිභෝජනය කරන ප්‍රමාණය වන 132.3 ට වඩා වැඩි බවත් එසේ ම, ප්‍රතිලාභ ලැබු ගොවීන්ගෙන් 50% වැඩි නියැදි ගොවීන් ප්‍රමාණයක් ආර්ථිකය ඉහළ නංවා ගැනීම සඳහා ව්‍යාපාරයක් ලෙස මෙය පවත්වා ගෙන යන බව ද අනාවරණය විය. කෙසේ වෙතත් මෙම කර්මාන්තයේ දී ආහාර සපයා දීම ගොවීන්ට ප්‍රධාන ගැටළුවක් වූ බව ද, ඒවාට අවශ්‍ය පිළියම් යෙදීම සඳහා අවශ්‍ය නීති සම්පාදනයට අවශ්‍ය තොරතුරු පශු සම්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමටත්, අදාළ ප්‍රතිපත්ති සඳහා අවශ්‍ය දැනුම හා තොරතුරු මඟින් දැනුම් දී ඇත.







2020 වර්ෂයේ ප්‍රකාශයට පත් කරන ලද පර්යේෂණය වූයේ කිරි කර්මාන්තය ට අදාළව අගයදාම විශ්ලේෂණය කිරීමේ අධ්‍යයනයයි. මෙම අධ්‍යයනය මඟින් කිරි නිෂ්පාදනයේ සිට පාරිභෝගිකයා දක්වා විවිධ ස්ථරවල දී කාර්යක්ෂමතාවය වැඩි කර ගන්නා ආකාරය පිළිබඳව විස්තරාත්මක ව විශ්ලේෂණය කරන ලදී. මෙහි දී අනාවරණය වූයේ කිරි නිෂ්පාදනය ලාභදායී ව්‍යාපාරයක් බවත්, කිරි ගොවියෙකු ලෙස පවුලේ වියදමට සරිලන හොඳ ආදායමක් ලබාගැනීම සඳහා එළදෙනුන් 14ක් පමණ කිරි පට්ටියක සිටිය යුතු බවත් ය. එමෙන් ම, කිරි නිෂ්පාදනයේ ශ්‍රමය සඳහා 50% ක් වියදමක් ද සාන්ද්‍ර ආහාර සඳහා 46% ක වියදමක් ද වන බව අනාවරණය විය. එසේ ම, කිරි නිෂ්පාදනයේ දී ශ්‍රමය, සාන්ද්‍ර ආහාර සඳහා යන වියදම සහ පශු වෛද්‍ය වියදම් සැලකිය යුතු (significant factors) බලපෑමක් සිදු කරයි.

ඊට අමතර ව, 2022 වර්ෂයේ දී කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වූ 2006 පශු සම්පත් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිය විශ්ලේෂණය කරන ලදී. මෙම ප්‍රතිපත්තිය මඟින් දියර කිරි පරිභෝජනය ඉහළ නැංවීම, අදාළ වෙළෙඳපොළ සංවර්ධනය කිරීම සහ කිරි නිෂ්පාදනය කාර්යක්ෂමතාවයන් ඉහළ නැංවීමත්, දේශීය ගව පට්ටිවල කිරි නිපදවීමේ ජානමය හැකියාව ඉහළ නැංවීම, කිරි නිෂ්පාදනය සඳහා මී ගවයන්ගේ දායකත්වය ඉහළ නැංවීම, කිරි ගොවීයන් ව්‍යවසායකයින් බවට පත් කිරීම, දේශීය කිරි නිෂ්පාදනයට හිතකර ආනයන හා මූල්‍යමය ප්‍රතිපත්ති හඳුන්වා දීම, මධ්‍ය පරිමාණ, මහා පරිමාණ කිරි ගොවිපළවල් ඉහළ නැංවීම සහ කිරි ගොවියන් සවිබල ගැන්වීම මූලික අභිමතාර්ථ විය. එසේ ම, 2015 වර්ෂය වන විට රටේ මුළු කිරි නිෂ්පාදනය මුළු අවශ්‍යතාවයෙන් 50%ක් නිපදවීම ද අරමුණු කර තිබුණි. පර්යේෂණයේ ප්‍රතිඵල අනුව 2018 වන විට ජාතික කිරි අවශ්‍යතාවයෙන් 40% සපුරා ඇති බව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දත්ත අනුව අනාවරණය විය. 2006 ද කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් හඳුන්වා දුන් මෙම ප්‍රතිපත්තිය මඟින් පෙන්වා දුන් ආකාරයට බොහෝ කාර්යයන් යම් පමණකට සාර්ථක වී තිබේ. කෙසේ වෙතත්, තවදුරටත් එම ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමත්, පෞද්ගලික මට්ටමේ සත්ත්ව අභිජනන මධ්‍යස්ථාන ආරම්භ කිරීම හා විශ්වාසයෙන් ගොවීන්ට අවශ්‍ය සතුන් මිල දී ගැනීමේ හැකියාවක් පැවතිය යුතු ය.

එසේ ම, 2023 වර්ෂයේ දී කිරි නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව විශ්ලේෂණය කිරීම වියළි කලාපය ආශ්‍රිත ව සිදු කරන ලදී. එමඟින් පැහැදිලි වූයේ කිරි පට්ටියක සිටින සතුන්ගෙන් කිරි එළදෙනුන් සංඛ්‍යාව, සතුන්ට සපයන සාන්ද්‍ර ආහාර ප්‍රමාණය ජලය සැපයෙන වාර ගණන සහ දවස පුරා ජලය සැපයීම යන කරුණු කිරි නිෂ්පාදනයට ඉතා වැදගත් ( significant) සබඳතාවයක් ඇති බව යි. එබැවින්, කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වියළි කලාපයේ සතුන්ට ඉහළ ගුණාත්මයෙන් යුතු ආහාර, පැය 24 පුරා ජලය සැපයීම සිදු කළ යුතු ය.

පශු සම්පත් අංශයේ සංවර්ධනය සඳහා අවශ්‍ය දැනුම හා තොරතුරු ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත යොමු කිරීමත්, විවිධ මට්ටමේ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, පුවත්පත් ලිපි, වාර්තා වැඩසටහන්, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මඟින් සිදු කර ඇත. මෙම කාර්යයන් තවදුරටත් පුළුල් කරමින් ශ්‍රී ලංකාවේ ගොවිජන ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් සේවය කිරීම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අභිමතාර්ථයයි.




සාගරිකා හිටිහාමු

**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**



# මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීම තුළින් ග්‍රාමීය ප්‍රජාවගේ ජීවිත පොහොසත් සහ ලස්සන කරමු

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ පවතින ආර්ථික හා සමාජීය ගැටළු බොහෝමයකට ප්‍රධාන සාධකයක් ලෙස ග්‍රාමීය ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාවය මට්ටමක පහල පැවතීම හඳුනා ගත හැකි ය. ශ්‍රී ලාංකික ජනතාවගෙන් 93%ක් වැනි ඉහළ ප්‍රතිශතයක් අකුරු කියවීමේ සහ ලිවීමේ හැකියාවෙන් යුක්ත වුව ද ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතාවය සාපේක්ෂව පහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 වාර්තාවන්ට අනුව මෙරට ජනතාවගේ සාමාන්‍ය මූල්‍ය සාක්ෂරතාවය 57.9% වන අතර ග්‍රාමීය ජනතාව අතර මූල්‍ය සාක්ෂරතාවය මීටත් පහළ මටටමක පවතින බව ප්‍රකාශ වේ. රටක ජනතාව ආර්ථික වශයෙන් කොතරම් ක්‍රියාකාරී ද, ඔවුන් ආර්ථික සංවර්ධනයට කොතෙක් දායක වන්නේ ද මෙන් ම ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ භුක්ති විඳින්නේ ද යන්නත් තීරණය වන්නේ එරට ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාවයේ මට්ටම අනුවය.

ඒ අනුව පුද්ගල ආර්ථික නැමියාව, ආර්ථික ක්‍රියාකාරීත්වයේ ප්‍රමාණය ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතාවය මත තීරණය වන අතර, පුද්ගල මූල්‍ය අන්තර්ග්‍රහනය(Financial inclusion) සඳහා ද මූල්‍ය සාක්ෂරතාවය සෘජුව බලපායි. පුද්ගල මූල්‍ය අන්තර්ග්‍රහනය, රටක ආර්ථික ක්‍රියාවලිය සඳහා පුද්ගල දායකත්වය සහ ක්‍රියාකාරීත්වය වර්ධනය වීමට මෙන් ම පුද්ගලයින් වෙත වඩාත් පුළුල්ව සහ සාධාරණව ආර්ථික ප්‍රතිලාභ ගලා යැම සඳහාත් අත්‍යවශ්‍යවේ. ඒ අනුව රටක ජනතාව ඉහළ මූල්‍ය සාක්ෂරතාවයකින් යුතුවීම රටේ ජනතාවගේ පුද්ගලික ආර්ථික වර්ධනයට මෙන් ම රටක සමස්ත ආර්ථික වර්ධනයට සහ සංවර්ධනය සඳහා ද අත්‍යවශ්‍ය වේ.

**මූල්‍ය සාක්ෂරතාවය යනු**

මූල්‍ය සමෘද්ධිය සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය සාක්ෂරතාවය අත්‍යවශ්‍ය සාධකයකි. සෑම විටම, දුර්වල මූල්‍ය කළමනාකරණය පුද්ගලයෙකුගේ



මූල්‍ය හැසිරීමට බලපෑම් කළ හැකි අතර, එනිසා ඔහු/ඇය මූල්‍ය අර්බුදයකට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇත. මූල්‍ය සාක්ෂරතාවය යන්නෙන් පුද්ගලයකු ප්‍රශස්ත මූල්‍ය තීරණ ගැනීමට සහ මූල්‍ය යහපැවැත්ම සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය දැනුවත්භාවය, ආකල්ප සහ හැසිරීමෙන් යුක්ත වීම අදහස් කෙරේ. ශ්‍රී ලංකාවේ පමණක් නොව බොහෝමයක් සංවර්ධනය වෙමින් පවතින රටවල දුප්පත් සහ ආන්තික ජීවිත ගතකරන (marginalized) ජනතාවගේ යහපැවැත්ම සහතික කිරීම සඳහා එකී ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාවය සැලකිල්ලට ලක්කළ යුතු ප්‍රධානම සාධකයක් බවට අද වනවිට ලොව පුරා පිළිගෙන තිබේ. දුර්වල මූල්‍ය සාක්ෂරතාවය හේතුවෙන් සිදුවන මූල්‍යමය වශයෙන් බහිෂ්කරණයට ලක්වීම (Financial exclusion) දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවට නිරන්තරයෙන් දුප්පත් ජීවිතයක් ගතකිරීමට හේතුවන අතරම ආර්ථික වශයෙන් සමෘද්ධිමත් වීමට ද බාධාකාරී වේ.





මෙරට ග්‍රාමීය ජනතාවගෙන් බහුතරයක් සෘජුව හා වක්‍රව කෘෂිකර්මාන්තය තුළින් සිය ජීවිකාව පවත්වාගෙන යන්නන් වේ. මොවුන් පෙළෙන ආර්ථික ගැටළු බොහෝමයක්ම සැලකිල්ලට ගත් කල ඒ බහුතරයක් සඳහාම දුර්වල මූල්‍ය සාක්ෂරතාවය හේතුවන බව පෙනී යයි. රටේ දරිද්‍රතාවයේ ජාතික සාමාන්‍යයට වඩා ග්‍රාමීය දරිද්‍රතාවය ඉතා ඉහළ අගයක් ගන්නා බව සංඛ්‍යාලේඛනවලට අනුව පෙනී යයි. ජන හා

සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව, මෙරට දුප්පතුන්ගෙන් 82%කට වැඩි ප්‍රමාණයක් ග්‍රාමීයව ජීවත් වන අතර ඒ අනුව රටේ දරිද්‍රතාවය ග්‍රාමීය සංසිද්ධියක් ලෙස ද නිරූපණය වේ. මෙම ග්‍රාමීය දරිද්‍රතාවයට මූලික වූ හේතු කාරණා බොහොමයක් සෘජුවම දුර්වල මූල්‍ය සාක්ෂරතාවය තුළින් නිර්මාණය වී ඇති බව රහසක් නොවේ.

**මෙරට ග්‍රාමීය ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කළ යුත්තේ ඇයි?**

ගෘහස්ථ ආදායම අඩුවීම, විකල්ප ජීවනෝපායන් හෝ ආදායම් මාර්ග නොමැතිකම, ණයගැතිභාවය, විශේෂයෙන්ම අනවශ්‍ය ණය ගැනීම්, ණය ගැනීම් සඳහා අවිධිමත් මූලාශ්‍රයන් වෙත යොමුවීම, අධික නිෂ්පාදන පිරිවැය, (බොහෝ විට අධික සහ වැරදි යෙදවුම් භාවිතය, පිරිවැය අවම කිරීමේ ක්‍රමවේද පිළිබඳ සැළකිලිමත් නොවීම නිසා) වෙළෙඳපොළ තොරතුරු නොසලකා හැරීම සහ නිසි ව්‍යාප්ති සහාය ලබා නොගැනීම, නිෂ්පාදන සැලසුම් නොමැතිකම විශේෂයෙන්ම මෙරට ග්‍රාමීය කෘෂිකාර්මික අංශය දෙස බැලීමේ දී දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ වේ. මේවා පැහැදිලිවම දුර්වල මූල්‍ය සාක්ෂරතාවයේ බලපෑම් නැතහොත් ප්‍රතිවිපාක වේ.

මෙරට ග්‍රාමීය ජනජීවිතය තුළ පැන නැඟී ඇති බරපතල සමාජ-ආර්ථික ගැටළු වන සියදිවි නසාගැනීම්, ගෘහස්ථ හිංසනය, පාසැල් හැර යාම ඉහළ මට්ටමක පැවතීම, උසස් අධ්‍යාපනය සඳහා දරුවන් යොමුවීම අඩුකම , ළමා මන්දපෝෂණය, තරුණ මව්වරුන් ගෘහ සේවිකාවන් ලෙස මැදපෙරදිග රටවලට සංක්‍රමණය වීම වැනි කාරණා සඳහා ද හේතු වී ඇත්තේ දරිද්‍රතාවය සහ ඊට ප්‍රධානම හේතුව වන දුර්වල මූල්‍ය සාක්ෂරතාව බව චෝදනා කිරීම වරදක් නැත. ඒ අනුව මෙම තත්ත්වය වළක්වාලීම සඳහා ග්‍රාමීය ජනතාවගේ ආදායම් වර්ධනය සඳහා හුදකලා උත්සහයන් ගැනීම වෙනුවට ඒ අතරම ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතාවය වර්ධනයට ද කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍යවේ. ඉහළ මූල්‍ය දැනුම, මූල්‍ය ආකල්ප, සහ මූල්‍ය චර්යාව නැතහොත් හැසිරීම මූල්‍යමය වශයෙන් ස්ථාවර, ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වඩාත් තාර්කික පුද්ගලයකු බිහිකිරීමට අත්‍යවශ්‍යම සාධක වේ.

**ග්‍රාමීය ප්‍රජාවගේ මූල්‍ය සාක්ෂරතාවය සහ සැළකිල්ලට ගතයුතු කරුණු**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමේ ආයතනය මෙරට ග්‍රාමීය කෘෂිකාර්මික ප්‍රජාවගේ මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ අධ්‍යනයක් මෑතක දී අම්පාර, අනුරාධපුර සහ කුරුණෑගල යන ප්‍රධාන කෘෂිකාර්මික දිස්ත්‍රික්ක තුනක ගොවි ප්‍රජා නියැදියක් ආශ්‍රයෙන් සිදු කරන ලදී. එකී පර්යේෂණයේ සොයාගැනීම් වලට අනුව සමස්ත නියැදියේ මූල්‍ය සාක්ෂරතාවයේ සාමාන්‍ය මට්ටම 52.5% කි. එසේම මූල්‍ය දැනුම සහ මූල්‍ය හැසිරීම අවම අගයන් හි පැවැති අතර මූල්‍ය ආකල්ප සාපේක්ෂව සතුටුදායක මට්ටමක පැවතුනි. අදාළ අගයන් පිළිවෙලින් 45%, 44% සහ 68% ක් විය. පිරිමි සහ කාන්තා මූල්‍ය සාක්ෂරතා මට්ටම් අතර විශාල පරතරයක් නොවූ අතර එම අගයන් පිළිවෙළින් 53% සහ 52% විය. අධ්‍යන ප්‍රජාවගේ මූල්‍ය සාක්ෂරතාවයට වැඩිම බලපෑමක් ඇති කළ සාධක ලෙස පුද්ගල ආදායම සහ අධ්‍යාපනය හඳුනාගත් අතර තරුණ පිරිස සාපේක්ෂ ව ඉහළ මූල්‍ය සාක්ෂරතාවයක් පෙන්නුම් කරන ලදී.

සමීක්ෂණයට සහභාගී වූවන්ගෙන් බහුතරය කෘෂිකර්මාන්තය හැර වෙනත් ආදායම් මාර්ග ඇතිකර ගැනීම පිළිබඳ එතරම් උනන්දුවක් නොදැක් වූ අතර බහුතරයක් (63% )තමන් ගතකරන ජීවන මට්ටමින් සෑහීමට පත්ව ඇති බවක් ද නිරීක්ෂණය විය. එසේම 95% කට වඩා වැඩි පිරිසක් ඔවුන්ගේ ආදායම කිසියම් සැලසුමකට අනුව වියදම් නොකරන බවක් පෙනී ගිය අතර එදිනෙදා වියදම් පිළිබඳ සටහන් තබා ගැනීමක් ද සිදු නොවේ. එසේ ම බහුතර පිරිසකට විකල්ප ජීවනෝපායන් හෝ ආදායම් මාර්ග පිළිබඳ නිපුණතා සහ කුසලතා නොතිබුණි. තව ද ගෘහ ඒකකවලින් බහුතරය සිය වියදම්, ඉතිරි කිරීම හෝ ආයෝජනය කිරීම් පිළිබඳ මාසික සැලැස්මක් සහිත නොවූව ද තම ආදායම සහ වියදම් කළමනාකරණය කිරීම පිළිබඳ විනයක් සහිත බව නිරීක්ෂණය විය.

අධ්‍යන ප්‍රජාවගේ මූල්‍ය නිෂ්පාදන (Financial Products) සහ සේවා භාවිතය (Financial Services) ඉතා අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. මෙය දුර්වල මූල්‍ය දැනුම පිළිබිඹු කරන ප්‍රමුඛ සාක්ෂියක් වේ. අධ්‍යන නියැදියෙන් බහුතරයකට (83%) ස්වයංක්‍රීය ගණක යන්ත්‍ර බැංකු කාඩ්පත් (ATM) තිබූ නමුත් ක්‍රෙඩිට් කාඩ්පත්

භාවිතය සහ ජංගම දුරකථන ඔස්සේ බැංකු කටයුතු සිදුකිරීමේ හැකියාව සහිත පිරිස පිළිවෙළින් 3% සහ 2%ක් වැනි අඩු මට්ටමක පැවතුනි. අධ්‍යනයට ලක්කල සියල්ලන් ම බැංකු ගිණුම් සහිත වූ නමුත් ඉන් 21%ක් එය පොහොර සහනාධාරය ලබා ගැනීමට පමණක් භාවිතා කරන බව හෙළිවිය. තව ද අධ්‍යයන ප්‍රජාවගෙන් 2% ක් පමණක් රක්ෂණ ඔප්පු සහිත වූ අතර බහුතරයකට (90%) නිශ්චිත විශ්‍රාම සැලැස්මක් ද නොමැත.

අධ්‍යයනයට ලක්කළ පිරිසෙන් කිහිප දෙනෙකු පමණක් කිසියම් ආයෝජන අදහසක් සහිත හෝ කෘෂිකර්මාන්තය හැර වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක ආයෝජනයක් කර ඇති බව නිරීක්ෂණය වූ අතර බහුතරය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ හෝ වෙනත් විකල්ප ආයෝජනයක් කිරීමට වඩා, ඔවුන් සතුව අතිරික්ත මුදලක් වේ නම් බැංකු ඉතුරුම් සඳහා වැඩි කැමැත්තක් දක්වන ලදී .මීට හේතුව ඔවුන් සතුව ව්‍යවසායක දැනුම, විකල්ප කුසලතා මෙන් ම ඒ සඳහා යොමුවීම් සහගත උත්ප්‍රේරණයන් නොවීමයි. තව ද බහුතරය ඔවුන්ගේ ජීවන තත්ත්වය සහ ඔවුන් සතුව ඇති දේ සමඟ පොරබදමින් සිටිනු මිස වෙනත් අභියෝගයක් හෝ අවදානමක් ගැනීමට පෙළඹවීමක් හෝ කැමැත්තක් නොමැති තත්ත්වයකට පත්ව තිබේ. මෙම තත්ත්වය පැහැදිලිවම දුර්වල මූල්‍ය සාක්ෂරතාවයේ ලක්ෂණයන් වන අතර ඒ අනුව ඔවුන්ගේ ආර්ථික ක්‍රියාරීත්වය ඔවුන් තුළ වන සැබෑ ශක්‍යතා මට්ටමට පහළ මට්ටමක පවතිවන බව පෙනේ. මෙම තත්ත්වය ඔවුන් මූල්‍ය බහිෂ්කරණයට ලක්වීමට (financial exclusion) මෙන් ම ඔවුන් විසින් ආර්ථිකයට ලබා දිය හැකි දායකත්වයත් ආර්ථික වශයෙන් ඔවුන්ට ලැබිය හැකි ප්‍රතිලාභ ද අවම වීමට හේතු වී තිබේ.

ඒ අනුව, අධ්‍යයනයේ සොයාගැනීම්වලින් පැහැදිලි වන පරිදි, ග්‍රාමීය කෘෂිකාර්මික ජනතාවගේ මූල්‍ය දැනුම වැඩි කිරීම, ඔවුන්ට දැනුම ලබා දීම සහ ඔවුන්ගේ ආදායම් මාර්ග පුළුල් කිරීම සඳහා ඔවුන්ගේ හැකියාවන් කුසලතාවයන් වැඩිදියුණු කිරීම ද අත්‍යවශ්‍යමය. එමඟින් ඔවුන්ට වැඩි ආයෝජන අවස්ථා සහ අවදානමක් ගැනීමට මෙන් ම ආර්ථික වශයෙන් වඩාත් ක්‍රියාකාරී වීමට ද හැකියාව ලැබෙනු ඇති අතර එය ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ සංවර්ධනයට සහ අවසානයේ සමස්ත ජාතියේම හිතසුව පිණිස හේතු වනු ඇත. තව ද මෙරට ජනතාවගේ සමස්තයක් ලෙස මූල්‍ය සාක්ෂරතාවය පහළ මට්ටමක පවතින බැවින් විධිමත්ව පාසල් අධ්‍යාපනය තුළින් මූල්‍ය සාක්ෂරතාවය සහිත ජනතාවක් බිහිකිරීමට අවශ්‍ය දැනුම ලබාදීමට ක්‍රියා කිරීම ද ජාතික අවශ්‍යතාවක් ලෙස සැලකිය යුතුය.




**ආචාර්ය චතුර ජයම්පති**
**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**


**ගොවි ජනතා සඟරාව තුළ ප්‍රකාශයට පත්වන ලිපි මඟින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ හෝ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අදහස් පිළිබිඹු නොවන අතර ලිපිවල අන්තර්ගතය සම්බන්ධ සම්පූර්ණ වගකීම ලේඛකයින් සතු ය.**



# ගොවි කාන්තාව, සවිබල ගැන් වූ කෘෂි ව්‍යවසායිකාවක් දක්වා දියුණු කිරීමට අදාළව සිදු කළ සමාජ- ආර්ථීක පර්යේෂණවල දායකත්වය

**සං**වර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවන් සියලු දෙනාම ලෝකයේ පවත්නා තත්ත්වයන් තුළ තමන්ට අදාළ සමාජයන් හි තමන්ට හිමි අවස්ථාවල පූර්ණ සාමාජිකත්වය ලබා ගැනීමට බොහෝ දුෂ්කරතාවයන්ට සහ විවිධ අත්දැකීම්වලට මුහුණ දී ඇත. එසේ ,ම කාන්තාවන්ට අධ්‍යාපනික අවස්ථාවන් හිමි වී දශක කිහිපයක් ගත වූව ද තවදුරටත් එවැනිම අත්දැකීම් අත් විඳිමින් සිටී. එසේ වුවත් වර්තමානය වන විට පුරුෂ පාර්ශ්වය හා සමාන වූ මානව වර්ගයක් ලෙසින් සමාජීය සන්දර්භය තුළ කෘෂි ක්ෂේත්‍රය හා අනෙකුත් කාර්මික හා සේවා ක්ෂේත්‍ර හරහා ඉස්මතුව සිටී. මෙසේ ඉස්මතුව සිටිමින් අවස්ථා වෙත ළඟා වීමේ පහසුම වූ මංපෙත් අත්නොහැර එය තිරසාරව පවත්වා ගැනීමට වර්තමාන කාන්තාව සූදානම් ද? නැතිනම්, පෙර පරිදිම අවස්ථා වෙත ළඟා වීමේ දී වඩාත් පහළ මට්ටමේ හා යටහත් මට්ටමේ වූ ප්‍රවේශයක් තවදුරටත් පවත්වා ගැනීමට සූදානම් ද? එනම්, කාන්තාවන්ගෙන් බහුතරයක් ආර්ථීක වශයෙන් වහල්භාවයේ වඩා අයහපත්ම වූ තත්ත්ව අත් විඳිමින් සාධාරණ නොවන ශ්‍රමයේ ප්‍රතිලාභ සහ දිගු වැඩ කිරීමේ වේලාවන් තුළ සහේතුකව ලාභ ශ්‍රමය සපයමින් සිටිනවාද? යන ප්‍රශ්න ගණනාවකට පිළිතුරු සෙවීම තුළ ග්‍රාමීය ආර්ථීක සංවර්ධනය සඳහා වු සවිබලගැන් වූ කාන්තා සහභාගීත්වය රඳා පවතී.

සවිබල ගැන් වූ කාන්තා දායකත්වය කෘෂි ආර්ථීක ක්ෂේත්‍රයේ පමණක් නොව අනෙකුත් සෑම ක්ෂේත්‍රයකම ආර්ථීක ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍යම කාරණයක් වේ. වර්තමානයේ ආර්ථීක සංවර්ධනය හා බැඳුණු පවුල් පසුබිම පිළිබඳ සැලකීමේ දී එහි ජීවන තත්ත්වය පවත්වා ගැනීමට හා උද්ධමනකාරී තරඟකාරී පීඩනයන්ට යටත් නොවී සිටීමට කාන්තාවන් තම පවුලට ඇයගේ ආදායම දායක කළ යුතුවීමම ඒ සඳහා උදාහරණ ලෙස ගත හැකි වැදගත් සාධකයකි. සරල සමාජීය ගති ලක්ෂණවලින් යුක්ත සමාජයක හෝ ජාතියක මනුෂ්‍ය වර්ගයාගෙන් අඩක් එහි නිෂ්පාදන හා බෙදාහැරීමේ බලවේගයන්ට දායක නොවන තත්ත්වයක් පැවතීම යම් රටකට යහපත් නොවන කරුණකි. එය පවත්නා තරඟකාරී සමාජය තුළ යම් රටක් පහළ මට්ටමකට ඇද දැමීමේ තත්ත්වයක් විය හැකිය. ඒ අනුව ලිංගිකත්වය පදනම් කර ගනිමින් සමාජය විසින් හඳුනාගෙන ඇති ස්ත්‍රී පුරුෂ වෙනස ආර්ථීක සංවර්ධනයේ දී ඊට වෙනස් ආකාරයකට විසඳාගත යුතුව ඇත. එනම්, ආර්ථීක සංවර්ධනය සඳහා කාන්තා දායකත්වය/ සහභාගීත්වය ඉහළ මට්ටමකට ගෙන ආ යුතුව ඇත. එසේ

නොවුනහොත් ලිංගිකත්වය පදනම් වූ සමාජීය බෙදීම සමස්ත සමාජයේම ජීවන තත්ත්වය පහත හෙළනු ලබන තියුණු යථාර්තයක් බවට පත් වනු ඇත.

මෙම තත්ත්වය වඩා විද්‍යාත්මකව හඳුනාගනු ලබන ගොවිජන අංශයේ සමාජ- ආර්ථික පර්යේෂණ සහ පුහුණු කිරීම් සිදු කරමින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා නව දැනුම ජනනය කෙරෙන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය වර්තමානයේ 53වෙනි වසරට පා තබා ඇති මොහොතක මේ සම්බන්ධයෙන් දශක 2ක කාල වකවානුවක් තුළ සිදු කෙරුණු කෘෂිකාර්මික කාන්තාව සහ ඇය කෘෂි ව්‍යාවසායිකාවක් ලෙස සවිබල ගැන්වීමේ අවශ්‍යතාවය පෙන්වා දීම හා සම්බන්ධ පර්යේෂණ සොයා ගැනීම් හා නිර්දේශ පිළිබඳව නැවත හැරී බැලීමක් මෙම ලිපිය මඟින් සිදු කෙරේ. එසේම එම සොයා ගැනීම් හා නිර්දේශ කෙතරම් දුරට වත්මන් ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ කාර්යයන්ට දායක වූවා ද යන්න සහ මෙම ක්ෂේත්‍රයට අදාළ ඉදිරි පියවරයන් ලෙස එම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නව දැනුම ජනනය කිරීමේ හැකියාවන් කවරේ ද යන්නත් මෙම ලිපිය තුළ සාකච්ඡාවට ලක් කෙරේ.

**ආර්ථික ව්‍යුහයේ වෙනස් වීම් ගොවි කාන්තාව කෙරෙහි බලපෑම සහ ජීවනෝපායයන් සංවර්ධනයට දායක වීම**

ගෙවී ගිය දශකයන් හි ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහයන් තුළ සිදු වූ වෙනස් වීම් අඩු ආදායම්ලාභී කෘෂිකාර්මික ප්‍රජාවන් හි ගොවි කාන්තාවට සිදුකළ බලපෑම පිළිබඳ වියළි කලාපීය ප්‍රදේශයන් පාදක කොට ගනිමින් අධ්‍යයනයට ලක් කිරීම පසුගිය දශක 2ක තුළ ගොවි කාන්තාව සම්බන්ධයෙන් සිදුකළ සුවිශේෂී පර්යේෂණ අධ්‍යයනයක් විය.

පර්යේෂණ අරමුණුවලට අනුව මෙම අධ්‍යයනයෙන් පෙන්වා දී ඇත්තේ, ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහයන් තුළ සිදු වූ වෙනස් වීම්වල බලපෑමෙන් නිෂ්පාදන භූමිකාව, ප්‍රජනන භූමිකාව සහ ප්‍රජා භූමිකාව යනුවෙන් සමාජීය වශයෙන් හඳුනාගෙන ඇති කාන්තාවගේ ප්‍රධාන භූමිකාවන් තුනෙ හි (Triple Role) පැහැදිලිව දැකිය හැකි වූ වෙනස්කම් සිදු වූ බවයි. විශේෂයෙන් ගොවි කාන්තාවන්ට අවස්ථාවන් ලබා ගැනීමටත් අවදානම් දැරීමටත් භාවිත කරන ලද උපාය මාර්ගයන් පිළිබඳව සැලකීමේ දී 1950 – 1970 දශකයන් නියෝජනය කරන කාන්තාවන්ට අවස්ථාවන් වෙත ප්‍රවේශ වීමේ දී අවදානම් රාශියකට මුහුණ දීමට සිදු වී ඇත. නමුත් ඔවුන්ට යැපුම් කෘෂිකර්මාන්තය තුළ අවස්ථා බහුල වීම නිසා මුහුණ දීමට සිදු වූ බොහෝ අවදානම් කළමනාකරණය කර ගැනීමේ හැකියාව පැවතුණු බව මෙම අධ්‍යයනය විසින් අනාවරණය කර ඇත. 1970 – 1990 දශකයන් වන විට සමාජය තුළ යටිතල පහසුකම් ක්‍රමයෙන් සංවර්ධනය වීමත් සමඟම කාන්තාවන්ට මුහුණ දීමට පැවති අවදානම අඩු වූ අතර අවස්ථාවන් ද බහුල විය. නමුත් එම අවස්ථා තවදුරටත් කෘෂිකාර්මික අංශයේ යැපුම් මට්ටමේම පැවතුණි. එනම්, කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළම වුව ද ගොවිපොළෙන් පරිබාහිර අවස්ථාවන්ට ප්‍රවේශ වීමේ අවස්ථාව කාන්තාවන්ට නොලැබුණු බව පෙන්වා දී ඇත. අනතුරුව 1990 - 2000 දශකය වන විට කාන්තාවන්ගේ ආත්ම අභිමානය, තීරණ ගැනීමේ හැකියාව ඉහළ යාම, සමඟ කාන්තා භූමිකාව නව දිශානතියකට හැරී ඇති නමුත් තවදුරටත් ගොවි කාන්තාව ඇතුළු සමස්ත කාන්තාවන්ගේ ඵලදායී ලෙස භාවිතා කළ හැකිව පවතින ශ්‍රමය ඌන උපයෝජිතව පවතින බව මෙම අධ්‍යයනය විසින් ඉතාමත් පැහැදිලි ලෙස ප්‍රතිපත්ති සම්පාදකයන් වෙත අනාවරණය කර දී ඇත.

එසේම ගොවි කාන්තාවන්ගේ ඌන උපයෝජිත ශ්‍රමය ඵලදායී ලෙස ආර්ථික සංවර්ධනය සඳහා දායක කර ගනිමින් ඒ හරහා විවිධ කාණ්ඩවලට අයත් කාන්තාවන්ගේ ජීවනෝපාය සංවර්ධනය ඉහළ දැමීමට සුදුසු යෝජනා ද මෙම අධ්‍යයනය විසින් පෙන්වා දී ඇත. ඒ අනුව, කෘෂිකාර්මික කාර්යයන්ට අවශ්‍ය යෙදවුම් සඳහා ගොවි කාන්තාවන්ගේ ප්‍රවේශය ඉහළ නැංවීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ගොවිපොළෙන් පිටත ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම, ප්‍රජා පාදක සංවිධාන ඇති කිරීම හරහා ගෘහස්ත මට්ටමේ ජීවනෝපාය වැඩි දියුණු කිරීමේ ප්‍රවේශයන් අවධාරණය කිරීමත්, දරිද්‍රතාවයෙන් යුත් කාන්තාවන් සඳහා ආර්ථික බල ගැන්වීමේ ව්‍යාපෘති හා වැඩසටහන් ඇති කිරීමත් පෙන්වා දී ඇත.

**ග්‍රාමීය අංශයේ ඌන උපයෝජිත කාන්තා ශ්‍රමය ආර්ථිකමය වශයෙන් සක්‍රීය කිරීම.**

2000 – 2010 දශකයන් හි ග්‍රාමීය අංශයේ සුලභව පවත්නා කාන්තා ශ්‍රමය ඵලදායී ලෙස උපයෝජනය කිරීම පිළිබඳව ඉහළ අවධානයක් යොමු විය. එහි ප්‍රතිඵලයක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 1970 සිට ක්‍රියාත්මක කරමින් සිටින කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති ඒකකය මඟින් ග්‍රාමීය මට්ටමේ සෑම ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයකම






“කාන්තා කෟෂිකර්ම ව්‍යාප්ති සංවිධාන” ස්ථාපිත කරමින් ගොවිපොළ, ගොවියා, ගෘහය සහ ගොවි කාන්තාව කේන්ද්‍ර කොට ගනිමින් ආහාර බෝග අංශයේ ප්‍රවර්ධනය හා ග්‍රාමීය ආර්ථික සංවර්ධනය අපේක්ෂා කෙරිණි. එහි දී කාන්තා ශ්‍රමය ඵලදායී ලෙස භාවිතා කිරීමේ පුළුල් අරමුණ ඉටුකර ගැනීම සඳහා ග්‍රාමීය මට්ටමේ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධානයන් මඟින් (ගොවි කාන්තා සමිති) ප්‍රධාන අරමුණු 6ක් ඉටුකර ගැනීමට අපේක්ෂා කෙරිණි. ඒ අනුව කාන්තාව සවිබල ගැන්වීම, කෘෂිකර්මයට සම්බන්ධ විවිධ ස්වයං රැකියා ක්‍රියාකාරකම් දියුණු කිරීම හරහා කාන්තාව ව්‍යවසායිකාවක් දක්වා ගොඩනැංවීම, ඉතිරි කිරීම්, ආයෝජන හැකියාව සහ නායකත්ව හැකියාව දියුණු කිරීම සමිති හරහා ඉටු කෙරිණි. මෙම ගොවි කාන්තා සමිති හරහා ඉටු කර ගැනීමට අරමුණු කළ තත්ත්වයන් හි ප්‍රගතිය කවරේ ද යන්න ඇඟයීමට ලක් කරමින් 2014 වර්ෂයේ දී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් අනාවරණය කරනු ලැබූ සොයා ගැනීම් ඉතා වැදගත් විය. ඒ අනුව අධ්‍යයනය විසින් පෙන්වා දුන්නේ, ග්‍රාමීය කෘෂිකාර්මික ප්‍රදේශයන් හි කාන්තාවන්ට ආදායම් උත්පාදන කාර්යයන් හි වඩාත් සාර්ථකව නියැළීමට මෙන් ම සමාජීය වශයෙන් සවිබල ගැන්වීමට ඉහළ පිටුවහලක් සැපයීමට උචිත ප්‍රවේශයක් ලෙස කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධාන හඳුන්වා දිය හැකි බවයි. එමෙන් ම, ග්‍රාමීය අංශය තුළ සුලභව පවතින කාන්තා සහ තරුණ ශ්‍රමය හඳුනා ගැනීමටත් සුදුසු ස්වයං රැකියා නිර්ණය කිරීමටත්, එමෙන් ම ඔවුන් ව්‍යවසායකයන් ලෙස ගොඩනැංවීමට අවශ්‍ය පුහුණු කිරීම් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමටත්, ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් මෙම කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධාන උපයෝගී කරගත හැකි බව ද අධ්‍යයනය විසින් හඳුනා ගන්නා ලදී. අධ්‍යයනය විසින් ප්‍රතිපත්ති සම්පාදකයින්ට ඉදිරිපත් කළ යෝජනා වූයේ, ග්‍රාමීය මට්ටමේ ඉතා සුලභව පවතින කාන්තා ශ්‍රමය සංවර්ධන ව්‍යාපෘති/වැඩසටහන් සඳහා උපරිම වශයෙන් දායක කර ගනිමින් ඔවුන් ව්‍යවසායකයින්ගේ මට්ටමට ගෙන ඒම සඳහා සුදුසු පුහුණු වැඩසටහන් සකස් කරමින් ඔවුන් පිළිබඳ පසු විපරම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරමින් එම කාන්තා ශ්‍රමය ආර්ථික වශයෙන් සක්‍රිය කිරීමේ අවශ්‍යතාවය ඉටු කළ යුතු බවයි.

ඒ අනුව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ග්‍රාමීය අංශය තුළ පවත්නා බහුල කාන්තා ශ්‍රමය උපයෝජනයේ වැදගත්කම පෙන්වා දීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් වූ දැනුම් පරතරය එම පර්යේෂණ සොයාගැනීම් සහ යෝජනා මඟින් සම්පූර්ණ වී ඇති බවට එම අධ්‍යයනය විසින් සාක්ෂි සපයනු ලබයි.



**ග්‍රාමීය අංශයේ කාන්තා ව්‍යවසායකත්ව හැකියාවන් දියුණු කිරීම**

2010 – 2020 දශකයන් හි 'කාන්තා ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය' පිළිබඳ ඉහළ මට්ටමේ අවධානයක් යොමුව පැවතිණි. එහි ප්‍රතිඵලයක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් හා සමගාමීව 1994 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබූ 'හෙළ බොජුන්හල්' වැඩසටහන මඟින් ගොවි කාන්තාවන්ට පමණක් නොව, හැකියාව සහ කැමැත්ත ඇති සියලුම ග්‍රාමීය කාන්තාවන්ගේ ව්‍යවසායක හැකියාවන් දියුණු කිරීම හරහා ස්ථාවර ආදායම් මාර්ගයක් ඇති කර පවුලේ ආර්ථිකය දියුණු කිරීමත් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමත් අපේක්ෂා කෙරිණි. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් 2018/2019 වර්ෂයේ දී මෙම හෙළ බොජුන්හල් වැඩසටහන් මඟින් අපේක්ෂිත අරමුණු ඉටු වූවා ද යන්න පිළිබඳවත් එම වැඩසටහන තවදුරටත් සාර්ථක වීමට සුදුසු දිශානතීන් හඳුනා ගැනීමත් සඳහා පර්යේෂණ අධ්‍යයනය සිදු කරනු ලැබිණි. එම අධ්‍යයනය මඟින් අනාවරණය වූ පරිදි ග්‍රාමීය මට්ටමේ ගොවි කාන්තාවන් හෙළ බොජුන්හල් සඳහා සම්බන්ධ වී ව්‍යවසායිකාවක් ලෙස ලැබූ පුහුණුව මඟින් ව්‍යවසායකත්ව ගුණාංග 7ක් විවිධ මට්ටම් අනුව ඉහළ ගොස් ඇති බව පෙන්වා දී ඇත. එනම්, කාන්තාවක් තුළ පැවති නිසඟ කුසලතාවය හා කැමැත්ත, ආර්ථික හා සමාජීය සවිමත්භාවය, පවුල හා සමාජය තුළ පිළිගැනීම ඉහළ යාම, කාර්ය සඳහා කැපවීම හා කාර්යාක්ෂමතාවය ඉහළ යාම, අවස්ථාවන් සොයා යෑමේ ගුණය ඉහළ යාම, අවදානම් දැරීම හා අභියෝග භාර ගැනීමේ හැකියාව ඉහළ යාම සහ තමා තුළ ඇති ශක්තීන් පිළිබඳ වූ විශ්වාසය ඉහළ යාම වැනි ගුණාංග මේ හරහා ඉහළ ගොස් ඇති බව පෙන්වා දී ඇත. එමෙන්ම ග්‍රාමීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ සුලභ කාන්තා ශ්‍රමය උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කර එය ග්‍රාමීය ආර්ථිකයට ඵලදායී ලෙස දායක කර ගැනීම සඳහා කාන්තාවන් ව්‍යවසායිකාවන් ලෙස පුහුණු කිරීමත්, ආර්ථික සවිබල ගැන්වීමත් සඳහා හෙළ බෝජුන්හල් වැනි වැඩසටහන් යෝග්‍ය බවත් එහි කළමනාකාරීත්වය හා සංවිධානාත්මක අංශයන් හි ක්‍රමවත්භාවය තවදුරටත් සකස් සිදු විය යුතු බවත් මෙම අධ්‍යයනය විසින් අනාවරණය කර ඇත.

හෙළ බොජුන්හල් වැඩසටහන මඟින් ග්‍රාමීය කාන්තා ශ්‍රමය තිරසර ව්‍යවසායකත්වයක් බවට පත් කිරීම සඳහා සුදුසු යෝජනා ලෙසින් අධ්‍යයනය විසින් පෙන්වා දී ඇත්තේ, එම කාන්තාවන් ව්‍යවසායිකාවන් ලෙස පුහුණු කර අවසන් වූ පසුවත් ඔවුන්ට තිරසාර ව්‍යවසායිකාවක් බවට පත් වීමට අවශ්‍ය මූල්‍ය හා ප්‍රාග්ධන පහසුකම් අනාවරණය කර දීමත්, පුද්ගලික ව්‍යවසායකත්වය හා සම්බන්ධ වීමට පහසුකම් සැපයීමත්, එසේම පුහුණුව ලබා ඉවත් වන කාන්තාවන්ට සාමූහික ව්‍යවසායකත්ව ප්‍රවේශයන්ට හා හැකියාව සහිත කාන්තාවන්ට තනි




ව්‍යවසායකත්ව ප්‍රවේශයකට යොමු කර ඊට අදාළ මාර්ගෝපදේශය ලබා දීමේ වැඩසටහන් දියත් කළ යුතු බවයි. අධ්‍යයන සොයාගැනීම් සහ යෝජනා අනුව වර්තමානයේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ද කාන්තා ව්‍යවසායකත්වය ඇතුළු සමස්ත ව්‍යවසායකයින් පදනම් කර ගනිමින් දිස්ත්‍රික්ක මට්ටමින් ව්‍යවසායකයින් ලෙස සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. එසේම කෘෂි ව්‍යවසායකයින් (කාන්තා/ පිරිමි) ලෙස දැනටමත් ක්‍රියාකාරී වන්නන් සඳහා ආයතනයේ ප්‍රවීණ පර්යේෂණ හා පුහුණු නිලධාරීන් විසින් දීප ව්‍යාප්ත මට්ටමේ ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන් මාලාවක් සැලසුම් කර වසර පුරා පවත්වා ගෙන යනු ලබයි. ඒ අනුව දැනට සිදු කෙරෙමින් පවතින ව්‍යවසායකත්ව වැඩසටහන් තුළින් මෙම අධ්‍යයනයන් හි සොයා ගැනීම් හා යෝජනාවල ක්‍රියාත්මක තත්ත්වය මනාව වන අයුරු පැහැදිලි කරනු ලබයි.

2016 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ගොවි කාන්තාවන් සම්බන්ධයෙන් වූ 'සිතමු' කාන්තා ගොවි සංවිධාන නමින් සංවිධාන 25,000ක් දිවයින පුරා ස්ථාපිත කරනු ලැබුවේ ද, ගොවි කාන්තාවන් සවිබල ගැන්වීමේ රාජ්‍ය අංශයේ අරමුණු සාක්ෂාත් කරගනු පිණිස වේ. මේ සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වගකීමෙන් බැඳී සිටින අතර කාන්තාවන්ගේ කෘෂිකාර්මික කටයුතු සඳහා යෙදවුම්, ණය සහ අලෙවිකරණ පහසුකම් සැපයීම හරහා ග්‍රාමීය පවුල්වල ජීවන තත්ත්වය නඟා සිටුවීම මෙම වැඩසටහන මඟින් අරමුණු කරගෙන ඇත. 'සිතමු' ගොවි කාන්තා සංවිධාන සම්බන්ධයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් 2020 වර්ෂයේ දී පර්යේෂණ අධ්‍යයනයන් සිදු කරන ලදී. මෙහි දී අධ්‍යයනය විසින් ඉලක්කගත කරනු ලැබුවේ 'සිතමු' ගොවි කාන්තා සංවිධානවල සංවිධානාත්මක, කළමනාකාරීත්වය හා මූල්‍යමය කාර්ය සාධනය, සහිත සංවිධානයක් ලෙසින් කාන්තාවන් සවිබල ගැන්වීමට දායක වන්නේ කෙසේ ද? යන්න අධ්‍යයනය කිරීම පිළිබඳව යි. එපමණක් ද නොව මෙම 'සිතමු' සංවිධාන හරහා ගෙවතු වගාව සහ ව්‍යවසායකත්ව සංවර්ධනය යන අංග කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යයනය සිදු කර ඇත. මෙහි දී ඉතා සුවිශේෂී අනාවරණ කිහිපයක් ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත යොමු කිරීමට මෙම අධ්‍යයනය සමත් වී ඇත. ඒ අනුව 'සිතමු' කාන්තා ගොවි සංවිධාන ග්‍රාමීය සංවර්ධනයට සහ දරිද්‍රතාවය අවම කිරීමට දායක වීම සඳහා විශාල විභවයක් සහිත කාන්තා සංවිධානයක් බව අධ්‍යයනය අනාවරණය කරයි. නමුත් එය සමස්තයක් ලෙස වත්මන් ගොවි









කාන්තාවන්ගේ යථාර්ථවාදී අවශ්‍යතාවයන්ට ප්‍රතිචාරයක් වනවාට වඩා නිලධාරී මට්ටමින් ජනනය වූ සංකල්පයක් බව ද අධ්‍යයනය විසින් පෙන්වා දී ඇත. එනම්, මෙම සංවිධානවලින් පිළිබිඹු වන්නේ ගුණාත්මක ජයග්‍රහණයක් නොව ප්‍රමාණාත්මක ජයග්‍රහණයක් බව හඳුනාගත හැකි බවයි. එමෙන්ම ‘සිතමු’ ගොවි කාන්තා සංවිධානයන් හි ගොවි කාන්තාවන් අතර ව්‍යවසායකත්ව අභිප්‍රාය තීරණය වීමට බොහෝ කරුණු බලපා ඇති බව පෙන්වා දෙන අතර මෙම සමිති හරහා ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීමට උචිත පරිසරයක් සැකසීමේ අවශ්‍යතාවය ද පෙන්වා දී ඇත.

1972 අංක 5 දරණ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පනත මඟින් ස්ථාපිත හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පර්යේෂණ අංශය හා අනෙකුත් සහාය අංශයන්ගේ ගෙවී ගිය දශකයන් හි පිළිබිඹුව දෙස විමර්ශනය කිරීමේ දී ග්‍රාමීය කෘෂිකාර්මික සංවර්ධනයේ දී කාන්තාවන්ගේ දායකත්වයක්, ගොවි කාන්තාවන් කෘෂි ව්‍යවසායිකාවන් දක්වා ගොඩනැංවීමේ කාර්යයන් අරමුණු කර ගනිමින් සිදු කරනු ලැබූ පර්යේෂණ අධ්‍යයනයන් හි නව දැනුමත් ගොවි කටයුතු අංශයේ කාන්තාවන් සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනයට ඉහළ මට්ටමේ දායකත්වයක් සපයා ඇති බව පැහැදිලි වේ. කෙසේ වුව ද වත්මන් ගොවි කාන්තාව විසින් අපේක්ෂා කරනු ලබන ගොවි ව්‍යවසායිකාවක් බවට පත් වීමේ අපේක්ෂාවට අවැසි මාර්ගය සැකසීම තවදුරටත් සිදු කෙරෙමින් පවත්නා තත්ත්වයක් බව සියලු කරුණු සම්පිණ්ඩනයේ දී පැහැදිලි කළ යුතු වේ.




**එම්.ඩී. සුසිලා ලූර්දු**
**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු**
**පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**










# හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ
# තොරතුරු හා සන්නිවේදනය

**ගො**විකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (**ARTI**) 1972 අංක 05 දරන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ 1972 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. එකී ආයතනය 1995 පෙබරවාරි මස 22 දින හිටපු කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය ගරු හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමන්ට ගෞරව පිණිස "හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය නමින් නාමගත කරන ලදී. මෙම ආයතනය වර්තමානය දක්වා ගොවිජන ක්ෂේත්‍රයට සක්‍රීය දායකත්වයක් ලබා දෙමින් ක්‍රියාත්මක වේ. ආයතනය පිහිටුවීමේ ප්‍රමුඛ අරමුණු අතර ප්‍රතිපත්ති කේන්ද්‍රීමය පර්යේෂණ දිරි ගැන්වීම, කෘෂිකාර්මික හා ග්‍රාමීය ක්ෂේත්‍රයන් හි පුහුණු අවශ්‍යතා සැපිරීම යනාදිය සඳහන් කළ හැකිය. වසර 53 ක් පුරාවට අඛණ්ඩ ව මෙරට ගොවිජන හා ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයේ පුරෝගාමියෙකු ලෙස සමාජ ආර්ථික පර්යේෂණ හා පුහුණු කිරීම් සිදු කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අතවශ්‍ය තොරතුරු සැපයීමෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය පුරෝගාමී මෙහෙවරක් සිදු කරයි. මෙම ආයතනය පහත සඳහන් පරිදි විවිධ අංශ සහ ඒකක වශයෙන් වර්ගීකරණය කොට තම සේවාව ඉටු කරන ලදී.

එනම්

1. කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය
2. කෘෂි සම්පත් කළමනාකරණ අංශය
3. පාරසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය
4. අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය
5. මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය
6. සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය
   - පුස්තකාලය
   - ප්‍රකාශන ඒකකය
7. පරිපාලන අංශය
   - ගිණුම් ඒකකය
   - වැඩසටහන් ඒකකය
8. අභ්‍යන්තර විගණන

වර්ෂ 2022 දී පහත සඳහන් පරිදි අංශ සහ ඒකකවල යම් සංශෝධන සහිතව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය තම සමාජ-ආර්ථික පර්යේෂණ ඔස්සේ සිදුකරන සේවාව කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ලබා දෙමින් සිටියි. එනම්

1. පරිසර අංශය
2. ආහාර පද්ධති අංශය
3. ග්‍රාමීය සංවර්ධන අංශය
4. අධ්‍යාපන හා පුහුණු අංශය
5. දත්ත කළමනාකරණ අංශය
6. තොරතුරු හා සංනිවේදන අංශය
7. පරිපාලන අංශය
    - ගිණුම් ඒකකය
    - වැඩසටහන් ඒකකය
8. අභ්‍යන්තර විගණන

ඉහත සෑම අංශයක් සහ ඒකකයක් තුළින් ම ආයතනයේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කරවනු වස් ක්‍රියාශීලී ඵලදායී සේවාවක් ඉටු කරනු ලබයි. ඉහත සඳහන් අංශ අතුරින් පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රධාන අංශ 05 තුළින් සිදුකරනු ලබන සමාජ-ආර්ථික පර්යේෂණ ඔස්සේ ජනනය වන නව දැනුම, පර්යේෂණ වාර්තා, සහ විවිධ ප්‍රකාශන ඔස්සේ ගොවි ජනතාව සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත සංනිවේදනය කරවීමේ ප්‍රමුඛ කාර්ය භාරය තොරතුරු සහ සන්නිවේදන අංශය විසින් ඉටු කරනු ලබයි.

**තොරතුරු සංනිවේදන අංශය**

වඩා ක්‍රියාශීලි පරිශීලන භාවිතාවක් ලෙස නව තාක්ෂණය ද යොදා ගනිමින් ග්‍රාහකයා වෙත තොරතුරු සංනිවේදනය කිරීමේ කාර්යය ඉටු කරනු ලබන්නේ මෙම අංශය මඟිනි. ඒ අනුව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ තොරතුරු සහ සංනිවේදන අංශය මඟින් ආයතනයේ සේවාව ජනගත කරවනු වස් තොරතුරු බෙදාහැරීම ක්‍රියාශීලීව කැපවීමෙන් සිදු කරයි.

ආයතනයේ තොරතුරු සහ සංනිවේදන අංශය පහත ඒකකයන්ගෙන් සමන්විත වේ.

1. ප්‍රකාශන ඒකකය
2. පුස්තකාලය
3. මුද්‍රණ ඒකකය
4. අලෙවි සැල

ඉහත සඳහන් එක් එක් ඒකක තම සේවාව ලබා දෙන ආකාරය විමසීම මෙහි දී ඉතා වැදගත් ය.

**ප්‍රකාශන ඒකකය**

ප්‍රකාශන ඒකකය මඟින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ නිලධාරීන් විසින් සිදුකරන සමාජ, ආර්ථික පර්යේෂණ ඔස්සේ ජනනය වන නව දැනුම විවිධ මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ජනගත කිරීම සිදු කරයි. ඒ අනුව මුද්‍රිත මාධ්‍ය ඔස්සේ පහත සඳහන් කාර්යයන් මෙම ඒකකය මඟින් සිදු කරනු ලබයි.

1. පර්යේෂණ වාර්තා ප්‍රකාශයට පත් කිරීම (ඉංග්‍රීසි, සිංහල, දෙමළ පරිවර්තන)

   ඉංග්‍රීසි බසින් ලියවුණු ප්‍රථම පර්යේෂණ අධ්‍යයනය ලෙස (English Research Study Series) “Cost of Production of Paddy – *Yala* 1972 Ranatunga A.S (1973) ER – 01 යන්න දැක්විය හැකිය

   ප්‍රථම වාර ප්‍රකාශන අධ්‍යයන මාලාව (Occasional Publication Series) No 1 වේ.
   “Thannimurippu Paripalana Sabai” Ellman A.O Ratnaweera D. de S (1973) EO – 01 යි.

   ඉංග්‍රීසි බසින් ලියවුණු ප්‍රථම ලේඛණ මාලාව (English Documentation Series) “Agrarian Structure and Development (1972) ED – 01 යි.

   සිංහල බසින් ලියැවුණු ප්‍රථම පර්යේෂණ අධ්‍යයන මාලාවේ පළමු පර්යේෂණය වන්නේ වී නිෂ්පාදන පිරිවැය 1972 - යල කේ.ඉසුම්,ඒ.එස්. රණතුංග (සි.ප අංක 1) යන්නයි.

   එමෙන්ම, සිංහල බසින් ලියැවුණු වාර ප්‍රකාශන අධ්‍යයන මාලාවක් ද පවතී.

තව ද,

1 කාර්ය පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම
2. Sri Lanka Journal of Agrarian Studies ප්‍රකාශයට පත් කිරීම
   පළමු ග්‍රන්ථය - Vol. 1 No 01 (1980)











3. ගොවි කටයුතු අධ්‍යයනය ශාස්ත්‍රීය සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීම
   පළමු ග්‍රන්ථය - වෙළුම 1 කලාප 1 (1984)
4. ගොවි ජනතා සඟරාව ප්‍රකාශයට පත් කිරීම
   පළමු ග්‍රන්ථය - 1974 ජනවාරි මස
5. කමනලම් සඟරාව ප්‍රකාශයට පත් කිරීම
6. ගොවි කටයුතු පුවත් හසුන නමින් ආයතනයේ සිදු වූ සහ සිදුවන සුවිශේෂී පුවත් සහිත ප්‍රකාශනයක් එළි දැක්වීම

මෙයට අමතර ව අත් පත්‍රිකා, කුඩා පොත් පිංචවල් ද තොරතුරු හා සංනිවේදන අංශය මඟින් ප්‍රකාශයට පත් කරයි. එසේ ම, තොරතුරු සහ සංනිවේදන අංශය ඔස්සේ ප්‍රදර්ශන, වැඩමුළු සංවිධානය කරනු ලබයි. එසේ ම, ජාතික ප්‍රදර්ශන සඳහා සහභාගි වෙමින් ආයතනය පිළිබඳ ප්‍රචාරක කටයුතු ද, ආයතන තුළින් ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ අලෙවි කිරීම ද සිදු කරනු ලබයි. තව ද අන්තර්ජාතික සම්මන්ත්‍රණ සංවිධාන කටයුතු සහ මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු ද මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් අතර වේ. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය දැනුම ජනනය කර බෙදා හරින ප්‍රමුඛ ආයතනයක් වීම නිසාම මෙම ආයතනය තුළින් ජනනය වන දැනුම ජනගත කිරීම සඳහා විද්‍යුත් මාධ්‍ය මෙන් ම මුද්‍රිත මාධ්‍ය තුළ ද වැඩි ඉඩ කඩක් හිමිවේ. ඒ අනුව, එහි මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු තොරතුරු හා සංනිවේදන අංශය මේ වන විටත් සිදු කරනු ලබයි.

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය සතුව ඇති "පුස්තකාලය"**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ ආයතනයේ පුස්තකාලය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වන්නේ ආයතනයේ පර්යේෂකයින්ට අවශ්‍ය දැනුම, තොරතුරු දත්ත හා සංඛ්‍යාලේඛන ලබා ගැනීම සඳහා සුදුසු මූලාශ්‍ර සපයා දීමයි. ඒ අනුව, ආයතනයේ ප්‍රථම පුස්තකාලය තිඹිරිගස්යායේ එලිබෑන්ක් පාරේ ස්ථානගත කරන ලදී. එය එවකට ග්‍රන්ථ 1490 ක් හා වාර සඟරා 40 ක් පමණ ප්‍රතිග්‍රහණ එකතුවකින් සමන්විත විය. මෙම පුස්තකාලයට අවශ්‍ය ග්‍රන්ථ මිල දී ගැනීම සඳහා ඇමරිකානු ආධාර ආයතනයක් වන ජාත්‍යන්තර සංවර්ධනය

සඳහා වූ එක්සත් ජනපද නියෝජිත ආයතනය (USAID) අනුග්‍රහය දක්වා ඇති අතර ආසියා පදනම (The Asia Foundation) පුස්තකාලය සඳහා ග්‍රන්ථ පරිත්‍යාග කරන ලදී. එකී මූලික අඩියරෙන් පසුව ආයතන සහ සංවිධාන රැසක් පසුගිය කාලවකවානුයේ මෙම ආයතනයේ පුස්තකාලයට ග්‍රන්ථ පරිත්‍යාග කරන ලදී.

1975 වසරේ දී පුස්තකාලය සඳහා ප්‍රථමවරට පුස්තකාලාධිපතිවරයෙකු ලෙසින් "විල්ෆ්‍රඩ් රණසිංහ මහතා" ආයතන කාර්යය මණ්ඩලය තුළින් තේරි පත්විය. 1983 වසරේ දී පුස්තකාලය පරිගණක හා දත්ත සැකසුම් අංශය පැවති ගොඩනැගිල්ල වෙත ගෙන යන ලදී. ඉඩකඩ සීමිත වීම මෙයට හේතුවයි. ඒ අනුව, 1997 වර්ෂයේ දී මෙම පුස්තකාලය වත්මන් පුස්තකාලය පිහිටි ගොඩනැගිල්ලට ස්ථානගත කර ඇත. මෙම පුස්තකාලය සතුව දුර්ලභ දේශීය, විදේශීය ග්‍රන්ථ, වාර ප්‍රකාශන, සඟරා, ලිපි මෙන්ම සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, ජනසංනිවේදනය, කෘෂිකර්මය ආදි විෂයයන්ට අදාළව විශාල ප්‍රකාශන එකතුවක් ද පවතී. මෙකී පුස්තකාලය දිවයිනේ පිහිටි පර්යේෂණ පුස්තකාල අතර ඉදිරියේම පැවතීම සුවිශේෂී කරුණකි.

විශේෂ පුස්තකාල වර්ගයට අයත් මෙම පුස්තකාලය තුළ විමර්ශන පහසුකම් ද සපයා තිබේ. 1997 වර්ෂයේ දී පරිගණක දත්ත පදනම (Database) CDS/ISIS මෘදුකාංග භාවිතා කරමින් පුස්තකාල ග්‍රන්ථ පරිගණක ගත කර තිබේ. 2002 වර්ෂයේ සිට වඩාත් දියුණු පුස්තකාල මෘදුකාංගයක් ලෙස WINISIS මෘදුකාංගය භාවිතා කරමින් නව දත්ත පදනමක් (Database) තුළට ග්‍රන්ථ ඇතුළත් කරගන්නා ලදී. මෙයට අමතර ව කාර්ය මණ්ඩලය සඳහා අන්තර්ජාල (Internet) පහසුකම් හා විද්‍යුත් තැපැල (E-mail) පහසුකම් සැපයීම ද පුස්තකාලය විසින් ලබා දෙන තවත් සේවාවකි. කෘෂිකාර්මික තොරතුරු ජාලයට (AGRINET) සම්බන්ධ පුස්තකාල සඳහා අවශ්‍ය තොරතුරු මෙම ජාලය හරහා ලබා ගැනීමේ හැකියාව ද පවතී.

**ආයතන ප්‍රකාශන සංඛ්‍යාංකගතකරණය (Digitization of Institute Publication)**

ජාතික විද්‍යා පදනම මඟින් ආරම්භ කරන ලද ආයතන ප්‍රකාශන සංඛ්‍යාංකරණය ව්‍යාපෘතිය මඟින් මෙම ආයතනයේ ප්‍රකාශන සංඛ්‍යාංකගතකරණය කර ඇති අතර (http://harti.nsf.ac.lk) මඟින් ඒ සඳහා ප්‍රවේශ වීමේ හැකියාව පවතී. මෙම කරුණ ආයතන නිල වෙබ් පිටුවේ HARTI Repository ලෙස සඳහන් කර ඇත. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ ආයතනික විද්‍යුත් ප්‍රකාශන එකතුවක් පවත්වාගෙන යාම හා මාර්ගගත ප්‍රවේශ මඟින් ඉක්මනින් ප්‍රකාශන වල ඇතුළත් තොරතුරු ලබා ගැනීමේ පහසුකම සැලසීමයි.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පුස්තකාලයෙ හි මේ වන විට ග්‍රන්ථ 25,000 ක් ඉක්මවා පවතින අතර දේශීය සහ විදේශීය සඟරා 20,000 ක් ද නිබන්ධන, පළ නො කළ වාර්තා, සිතියම්, වාර්ෂික වාර්තා, පුවත්පත් ලිපි ද දක්නට ලැබේ. ඒ අනුව, HARTI පුස්තකාලය සතුව පහත සඳහන් විෂයයන්ට අදාළ ව දේශීය සහ විදේශීය ප්‍රකාශන එකතුවක් ද පවතී.

- ගොවිජන ව්‍යුහය
- ගොවිජන ප්‍රතිසංස්කරණය
- කෘෂිකාර්මික ණය
- කෘෂිකාර්මික සංවර්ධනය
- කෘෂිකාර්මික බෝග
- ඉඩම් ප්‍රතිසංස්කරණය
- වාරි මාර්ග
- ජල කළමනාකරණය
- ආර්ථික සංවර්ධනය
- සමාජ විද්‍යා
- දේශපාලනය
- දිළිඳුකම පිළිබඳ සංඛ්‍යානමය දත්ත
- ග්‍රාම සංවර්ධනය
- ස්ත්‍රී පුරුෂ සමාජගත බව පිළිබඳ ගැටලු
- ජනශ්‍රැති
- වැවිලි කර්මාන්තය








- ආහාර සහ පෝෂණය
- පරිසරය සහ ස්වාභාවික සම්පත්
- ජෛව තාක්ෂණය
- ඉතිහාසය
- අලෙවිය
- වෙළෙඳාම
- පර්යේෂණ ක්‍රමවේදය

මෙම පුස්තකාලය මඟින් ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයට මහඟු සේවාවක් සපයයි. ආයතනයේ කාර්ය මණ්ඩලය හැරුණු විට ආයතනයට පැමිණෙන බාහිර පර්යේෂකයන්, උපදේශකයන්, විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යයන් මෙන්ම පරිබාහිර ආයතන වල පුස්තකාල සේවාව අවශ්‍ය පිරිස් වෙත පුස්තකාල කාර්ය මණ්ඩලය මඟින් ලබා දෙන සේවාව අගය කළ යුතුම ය.

**මුද්‍රණ ඒකකය**

ප්‍රකාශන අංශය පිහිට වූ මුල් කාලවකවානුවේ සිට ම ආයතනය මඟින් මුද්‍රණ කටයුතු සඳහා ද කාර්යයන් ආරම්භ කොට තිබේ. මුල් කාලීන ව, එහි කාර්ය මණ්ඩලය කාර්මික නිලධාරි, රෝනියෝ ක්‍රියාකරු, පොත් බැඳුම්කරු, මුද්‍රණ සහායක යන තනතුරු ඔස්සේ තම කාර්යයන් ඉටු කොට තිබේ. එසේ වුව ද 2013 වසරේ සිට මේ දක්වා නව කාර්ය මණ්ඩලය ලෙස පොත් බැඳුම්කරු සහ මුද්‍රණ සහායක යනාදි ලෙස තම කාර්යයන් ඉටු කරනු ලබයි. මුද්‍රණ ඒකකය මඟින් ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය තීරණය කරනු ලබන සියලුම ප්‍රකාශන මුද්‍රණය කිරීම සිදු කරයි. එසේ ම, එකී සෑම මුද්‍රිත ප්‍රකාශනයක් සඳහා ම මිල තීරණය කිරීම සඳහා ඔවුන් විසින් නිත්‍යානුකූලව සකස් කරන ලද නිර්ණායකයන් සහිත ව ගණනය කිරීමක් සිදු කොට එක් ප්‍රකාශනයක් සඳහා මිල තීරණය කිරීම ද සිදු කරයි.

**අලෙවි සැල**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශන අලෙවි සැල අලෙවි සහකාරවරයෙකු යටතේ පවත්වාගෙන යනු ලබයි. ආයතනය විසින් නිකුත් කරන ලද මිල සඳහන් සියලුම ප්‍රකාශන අලෙවි සැලෙන් මිල දී ගැනීමේ හැකියාව පවතී. අලෙවි සැල තුළින් අලෙවි කරනු ලබන සියලුම ප්‍රකාශනවල මූල්‍ය පරිපාලනය ආයතනයේ මුදල් ඒකකය මඟින් සිදු කරනු ලබයි. ආයනයෙ හි ප්‍රචාරක කටයුතු සඳහා සිදු කරනු ලබන ප්‍රදර්ශන සඳහා අලෙවි සැල නිරන්තරයෙන් සම්බන්ධ වේ.

තව ද තොරතුරු හා සංනිවේදන අංශය තුළින් 2021 නොවැම්බර් මස සිට “ගොවිමිණ” නමින් කෘෂිකාර්මික පුවත්පතක් ද, 2023 වර්ෂයේ මාර්තු මස සිට “ගොවිමිණ” නමින් දෙමළ මාධ්‍ය සඟරාවක් ද ප්‍රකාශයට පත් කරන ලදී. එමෙන් ම, 2022 ජනවාරි මස සිට “HARTI Youtube” නාලිකාව තුළින් ද අප ආයතනය සතුව පවතින දැනුම ජනගත කිරීම ආරම්භ කරන ලදී. එසේම කෘෂිකාර්මික ක්ෂේත්‍රයට විශේෂිත ව 2022 මැයි මස සිට “HARTI Photo Library” නමින් ඡායාරූප එකතුවක් මෙම ආයතනය විසින් පවත්වාගෙන යනු ලබයි.

ඉහත සඳහන් කළ ආකාරයට තොරතුරු හා සංනිවේදන අංශය, ආයතනයේ පර්යේෂණ තුළින් ජනනය කරන දැනුම ජනගත කිරීමට සක්‍රීය දායකත්වයක් ලබා දෙයි. එසේ ම, යම් ආයතනයක පැවැත්ම වෙනුවෙන් ජනමාධ්‍ය ඔස්සේ සිදු කරනු ලබන ප්‍රචාරණය ආයතනයේ අභිවෘද්ධියට විශාල බලපෑමක් සිදු කරනු ලබන බව ද මෙහිලා සඳහන් කළ යුතුම ය.




**ඉන්දීවරි දිසානායක**

**ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනි**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**



# හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සතු දේශන ශාලා පහසුකම්



| | | |
|---|---|---|
| මහින්ද සිල්වා ශ්‍රවණාගාරය අසුන් සංඛ්‍යාව | - | 200 |
| නව සම්මන්ත්‍රණ ශාලාව අසුන් සංඛ්‍යාව | - | 50-100 |
| නාරායනසාමි සම්මන්ත්‍රණ ශාලාව අසුන් සංඛ්‍යාව | - | 75 |
| සුබසිංහ සම්මන්ත්‍රණ ශාලාව අසුන් සංඛ්‍යාව | - | 50 |
| දේශන ශාලාව අසුන් සංඛ්‍යාව | - | 40 |
| කමිටු කාමර 1-2අසුන් සංඛ්‍යාව | - | 12 |







# හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සතු නේවාසිකාගාරය











කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි නියුතු දෙස් සහ විදෙස් සම්පත්ධාරීන් හට වායු සමනය කළ තනි සහ යුගල කාමර වශයෙන් නවාතැන් පහසුකම් සහන මිලට මෙහි දී ලබා ගත හැක.

විද්‍යුත් තැපැල - hartihostel@gmail.com

සෘජු දුරකතන අංකය - 0112698599

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ
ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

දුරකතන 0112696981, 0112698540-41
ෆැක්ස් 0112691360, 0112692423